# TOPIC 03 - භාණ්ඩ විකිණීමේ නීතිය

# Law of Sale of Goods

## බලපවත්නා නීතිය හා භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මූලිකාංග

*භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ අදාළ වන්නේ 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතයි.* එය 1893 එංගලන්ත භාණ්ඩ විකිණීමේ පනතෙහි පදානුගත අනුවර්තනයක් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් අදාළ වනුයේ ඉංග්‍රීසි නීති මූලධර්මයි. භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් රෝම ලන්දේසි නීති මූලධර්ම අදාළ නොවන බව අධිකරණ විසින් විනිශ්චය කොට ඇත. ඒ අනුව 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා ඉංග්‍රීසි පොදු නීති මූලධර්ම ඇසුරින් භාණ්ඩ විකිණීමට අදාළ නීතිය අධ්‍යයනය කළ හැකිය.

ipcelearning.lk®

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 02 වන වගන්තිය මගින් "භාණ්ඩ විකිණීමේ ගිවිසුමක්" යන්න පහත සඳහන් ආකාරයට නිර්වචනය කරයි.

"මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවකට, භාණ්ඩවල අයිතිය විකුණුම්කරු විසින් ගැණුම්කරුට පැවරීමේ හෝ පැවරීමට එකඟ වීමේ ගිවිසුමකි."

*ඉහත කී නිර්වචනයට අනුව, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක පහත සඳහන් මූලිකාංග තුන පැවතීම අත්‍යවශ්‍ය වේ. ඒවා නම්,*

1. ගිවිසුමේ විෂය වස්තුව භාණ්ඩ විය යුතුය.

2. භාණ්ඩවල අයිතිය, විකුණුම්කරු විසින් ගැණුම්කරුට පැවරීමක් හෝ පැවරීමට එකඟ වීමක් තිබිය යුතුය.

3. මිල යැයි කියනු ලබන, මුදල් ප්‍රතිෂ්ඨාවක් තිබිය යුතුය.

## භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව භාණ්ඩ විය යුතුය

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 59 වන වගන්තිය භාණ්ඩ යන්න නිර්වචනය කරන්නේ "මුදල් හැරුණු විට සියලු චංචල දේපල" වශයෙන්ය. එසේම එම වගන්තිය තවදුරටත් භාණ්ඩ යන්නට වැඩෙමින් පවත්නා අස්වැන්න සහ ගිවිසුමක් යටතේ වෙන් කිරීමට එකඟ වී ඇති, පොළවට සවිව පවතින්නා වූ හෝ පොළවට කොටසක් වන්නා වූ දේ භාණ්ඩ යන්නට ඇතුලත් වන බව දක්වයි. ඒ අනුව නිශ්චල දේපළ එනම් භූමිය හා භූමිය මත ස්ථිරව සවිව ඇති දෑ විකිණීමට එළඹෙන්නා වූ ගිවිසුමක් භාණ්ඩ විකිණීමේ නීතියෙන් ආවරණ නොවන අතර ඒ සම්බන්ධයෙන් දේපළ නීතිය බලපායි. කෙසේ නමුත් පනතේ 59 වන වගන්තිය සුවිශේෂිව දක්වා ඇති ආකාරයට භූමිය මත වැඩෙන අස්වැන්න හා භූමියට සවිකොට හෝ භූමියට සම්බන්ධව ඇති දෑ භූමියෙන් වෙන්කොට විකිණීම සිදු කරයි නම් එම අවස්ථා භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යටතේ ආවරණය වේ.

උදාහරණ

- යමෙකු සිය නිවස විකිණීමට ගිවිසුමකට එළඹේ නම් එය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක්නොවේ.
- රත්නපුර ප්‍රදේශයේ ඉඩම් හිමිකරුවෙකු එළඹෙන රඹුටන් වාරයේදී තම ඉඩමේ පිහිටි රඹුටන්ගසේ ඵලදාව රු 50,000 කට විකිණීමට එකඟත්වය පළ කරයි නම් එය භාණ්ඩ විකිණීමේගිවිසුමකි.
- යමෙකු තම ඉඩමෙන් කපන ලද බොරලු කියුබ් එකක් රු 5000 අලෙවි කරයි නම් එය භාණ්ඩ විකිණීමේ ගිවිසුමකි.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 59 වන අර්ථ නිරූපන වගන්තිය මුදල් භාණ්ඩයක් ලෙස නොසලකයි. මන්ද යත් මුදල් යනු භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ප්‍රතිෂ්ඨාව වන බැවිනි. කෙසේ නමුත් මුදලේ නාමික වටිනාකම සලකා නොව වෙනත් යම් ද්‍රව්‍යමය හෝ පෞරාණික වටිනාකමක් සලකා විකිණීමේ ගිවිසුමකට එළඹේ නම් එහිදී මුදල් භාණ්ඩ වශයෙන් සැලකේ.

ඉහත අර්ථ නිරූපන වගන්තිය සඳහා අධිකරණ විසින් විවිධ අවස්ථාවන්හි අර්ථ නිරූපන සපයමින් ඇතැම් චංචල දේපළ මෙම වගන්තියේ භාණ්ඩ යන අර්ථය තුළ ගැනිය හැකිද යන්න සාකච්ඡා කොට ඇත. R V Australian Red Cross Society නඩුවේදී අධිකරණය පුද්ගලයෙකුට ලබා ගැනීම සඳහා ලේ ලබා දීම භාණ්ඩ විකිණීමක් නොවන බව ප්‍රකාශ කරන ලදී. ශ්‍රී ලංකාවේ විනිශ්චිත TheCommercial Bank Of Ceylon V The Director General Of Customs and Others නඩුවේදි සීඩී තැටියක අන්තර්ගත කරන ලද පරිගණක මෘදුකාංගයක් භාණ්ඩයක් නොවන බව

තීරණය කරන ලදී. කෙසේ නමුත් විදුලිය හා ගෑස් භාණ්ඩ වශයෙන් සැලකිය හැකි බව අධිකරණ විසින් පිළිගෙන ඇත. J E Perea V M.M.Zainudeen නඩුවේදී ලොතරැයි ටිකට්පතක් විකිණීම භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් නොවන බව දක්වා ඇත.

නීතිය මඟින් ක්‍රියාත්මක කල හැකි දේපළ සම්බන්ධයෙන් අධිකරණයේ විනිශ්චය වනුයේ ඒවා භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 02 වන වගන්තිය යටතේ භාණ්ඩ වශයෙන් සැලකිය නොහැකි බවයි. ඒ අනුව සමාගමක කොටස්, සුරැකුම්පත්, ස්වාධිකාරය සහ බුද්ධිමය දේපළ යනා දී ස්පර්ශ කළ නොහැකි වත්කම් භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ආවරණයෙන් බැහැර වේ.

## භාණ්ඩ වර්ගීකරණය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වන භාණ්ඩ පවත්නා භාණ්ඩ හෝ අනාගත භාණ්ඩ විය හැකිය.

### පවත්නා භාණ්ඩ

පවත්නා භාණ්ඩයක් යනු භාණ්ඩ විකිණීමේ ගිවිසුට එළඹෙන අවස්ථාවේදී විකුණුම්කරුට අයත්ව තිබූ හෝ භුක්තියේ තිබූ භාණ්ඩ වේ. මෙයට ඇපයට හෝ කුලියට දුන් භාණ්ඩ, නියෝජිතයන්ගේ භුක්තියේ තිබූ භාණ්ඩ යනාදියද ඇතුලත් වේ.

උදාහරණ - සෙහාන් මෝටර් රථ අලෙවිකරුවෙකි. ඔහු ජපානයෙන් ආනයන කළ හොන්ඩා සිවික් රථයක් ප්‍රසාද්ට විකිණීමට එකඟ වෙයි. ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ෂෙහාන්ගේ සන්තකයේ මෝටර් රථය පවතින නිසා එය පවත්නා භාණ්ඩයකි.

පවත්නා භාණ්ඩයක් නිශ්චිත හෝ අවිනිශ්චිත භාණ්ඩයක් විය හැකිය. භාණ්ඩයක නිශ්චිත හෝ අවිනිශ්චිතභාවය භාණ්ඩයක අයිතිය මාරු වීම, පාර්ශවයන්ගේ ප්‍රතිකර්ම යනාදී කාරණාවලදී වැදගත් වේ.

### නිශ්චිත භාණ්ඩ

නිශ්චිත භාණ්ඩ යනු ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ගිවිසුමේ විෂය වස්තුව වන්නා වූ භාණ්ඩ බවට පාර්ශවකරුවන් එකඟ වූත් හඳුනා ගන්නා වූත් භාණ්ඩ වේ.

උදාහරණ - ඉහත උදාහරණයේ ෂෙහාන් සතුව හොන්ඩා සිවික් වර්ගයේ මෝටර් රථ පහක් පවතී නම් හා එම රථ අතුරින් නිල් පැහැති හා එංජින් අංක 12345432 දරන මෝටර් රථය මිලට ගැනීමට ෂෙහාන් එකඟ වූයේ නම් එකී මෝටර් රථය නිශ්චිත භාණ්ඩයකි.

## අවිනිශ්චිත භාණ්ඩ

අවිනිශ්චිත භාණ්ඩ යනු ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ගිවිසුමේ විෂය වස්තුව වන්නා වූ භාණ්ඩ බවට පාර්ශවකරුවන් එකඟ වූ නමුත් ගිවිසුමට අදාළ භාණ්ඩ වශයෙන් හඳුනා නොගත් භාණ්ඩ වේ.

උදාහරණ - ඉහත උදාහරණයේ ෂෙහාන් සතුව පවතින මෝටර් රථයක් මිලට ගැනීමට ප්‍රසාද් එකඟ වුවද මෝටර් රථ පහ අතුරින් තමා මිලදී ගන්නා මෝටර් රථය කුමක්දැයි එකඟතාවයකට නොපැමිණියේ නම් ගිවිසුමේ විෂය වස්තුව අවිනිශ්චිත භාණ්ඩයකි.

## අනාගත භාණ්ඩ

ගිවිසුම ඇති වීමෙන් පසු විකුණුම්කරු විසින් නිෂ්පාදනය හෝ අත්පත් කිරීම සිදු කරගත යුතු භාණ්ඩ අනාගත භාණ්ඩ වේ.

ipc-elearning.lk®

උදාහරණ - ඉහත උදාහරණයේ ෂෙහාන් හොන්ඩා සිවික් වර්ගයේ මෝටර් රථයක් ජපානයෙන් ආනයනය කර ප්‍රසාද්ට විකිණීමට එකඟ වූයේ නම් ගිවිසුමේ විෂය වස්තුව වන එම මෝටර් රථය අනාගත භාණ්ඩයකි.

Howell V Coupland (1921) 1 Ch 606

මෙම නඩුවේදී ඉඩමක වවා තිබූ අර්තාපල් වගාවෙන් අර්තාපල් ටොන් 200ක් විකිණීමට එකඟ විය. අධිකරණය මෙම ගිවිසුම භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් වශයෙන් හඳුනා ගන්නා ලදී.

## භාණ්ඩවල අයිතිය පැවරීමක් හෝ පැවරීමට එකඟ වීමක් පැවතිය යුතුය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක අනිවාර්ය අංගයක් වනුයේ භාණ්ඩයක අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට මාරු වීමයි. කෙසේ නමුත් එම අයිතිය මාරු වීම වර්තමාන අයිතිය මාරු වීමක් හෝ අනාගත අයිතිය මාරු වීමක් විය හැකිය.

ගිවිසුමකට එළඹී වහාම භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට මාරු වේ නම් එවැනි ගිවිසුමක් "විකිණීමේ ගිවිසුමක්" වශයෙන් හැඳින්වේ.

භාණ්ඩවල අයිතිය අනාගතයේ පැවරීමක්, එනම්, භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට ගිවිසුමට එළඹීමෙන් පසු අවස්ථාවක මාරු වීමක් සිදුවේ නම් එවැනි ගිවිසුමක් " විකිණීමට එකඟ වීමේ ගිවිසුමක්" වශයෙන් හැඳින්වේ.

යම් ගිවිසුමක් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක්ද විකිණීමට එකඟ වීමේ ගිවිසුමක්ද යන්න පාර්ශවයන්ගේ හැසිරීම, සිද්ධිමය කරුණු මත හා පාර්ශවයන්ගේ චේතනාව මත තීරණය වන්නක් බව අධිකරණය විසින් විනිශ්චය කොට ඇත.

විකුණුම්කරුවෙකු විසින් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් කඩ කර ඇති අවස්ථාවකදී ගැණුම්කරුට භාණ්ඩවලට එරෙහිව හා විකුණුම්කරුට එරෙහිව ප්‍රතිකර්ම පවතින මුත් භාණ්ඩ විකිණීමට එකඟවීමේ ගිවිසුමක් කඩකර ඇති අවස්ථාවකදී ගැණුම්කරුට පවතින්නේ විකුණුම්කරුට එරෙහි ප්‍රතිකර්ම පමණි.

මෙහිදී සිහියේ තබාගත යුතු වැදගත් කාරණයක් වනුයේ අයිතිය පැවරීම හා භුක්තිය පැවරීම යනු වෙනස් සංකල්ප දෙකක් බවත් ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී භුක්තිය පැවරූ පමණින් එයවිකිණීමේ ගිවිසුමක් බවට පත් නොවන බවයි.

Jayasena Perera V Ratnadasa (1981) 1 SLR 398

මෙම නඩුවේදී පැමිණිලිකරු හා විත්තිකරු අතර විත්තිකරුගේ ලොරි රථය විකිණීම සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹෙන ලදී. ලොරියේ වටිනාකමෙන් රු 16,000 පැමිණිලිකරු ගෙවූ අතර ඉතිරි රු20,000 ලීසිං පහසුකම් ලබා ගැනීමෙන් පසු අප්‍රේල් මස 24 වන දින ගෙවීමට එකඟ විය. විත්තිකරු ලොරියේ ලියාපදිංචි සහතිකය අස්ථානගත වී ඇති බැවින් එය 24 වන දින සොයා දීමටත් එම අවස්ථාවේදී මෝටර් රථ අඟඩා පනත ප්‍රකාර මෝටර් රථ පවරා දීමේ ආකෘති පත්‍ර අත්සන් කිරීමටත් එකඟව ලොරි රථය පැමිණිලිකරුට බාර දුන්නේය. පැමිණිලිකරු තමාගේ ව්‍යාපාරයේ නම ලොරියේ සඳහන් කර ලොරිය අලුත්වැඩියා කරන ලදී. කෙසේ නමුත් එකඟ වූ පරිදි රු 20,000 ලබා දීම හෝ ලොරියේ ලියාපදිංචි සහතිකය ලබා දීම හෝ මෝටර් රථ අඟඩා පනත ප්‍රකාර මෝටර් රථ පවරා දීමේ ආකෘති පත්‍ර අත්සන් කිරීම සිදු නොවුණි. පසු දිනක විත්තිකරු ලොරියේ සන්තකය බලෙන් පැමිණිලිකරුගෙන් ලබා ගත් අතර පැමිණිලිකරු අධිකරණයෙන් ඉල්ලා සිටින ලද්දේ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සංස්ථාපනය වී ඇති බැවින් තමාට මෝටර් රථයේ අයිතිය පවතින බවයි. කෙසේ නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ශවයන්ගේ එකඟතා, අත්සන් කරන ලද ලේඛන හා පාර්ශවයන්ගේ හැසිරීම සලකා බලා ප්‍රකාශ කරන ලද්දේ

දෙපාර්ශවය එකඟව ඇති ගිවිසුම භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් නොව විකිණීමට එකඟ වීමේ ගිවිසුමක් බවත් ඒ අනුව ලොරි රථයේ අයිතිය විත්තිකරු වෙත පවතින බවත්ය.

**මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවක් තිබිය යුතුය**

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක තවත් වැදගත් මූලිකාංගයක් වන්නේ ප්‍රතිෂ්ඨාවයි. එය මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවක් විය යුතුය. අවම වශයෙන් ප්‍රතිෂ්ඨාවෙන් කොටසක්වත් මුදලින් විය යුතුය.

භාණ්ඩවලට භාණ්ඩ හුවමාරු වීමේ ගිවිසුමක ප්‍රතිෂ්ඨාවක් තිබෙන්නේ වුව ද එහි මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවක් නොමැති නිසා එය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් නොවේ.

Aldridge V Johnson (1857) 7 E&B 883

මෙම නඩුවේදී ගවයින් 50 දෙනෙකු බාර්ලි බුසල් 100ක් සමග හුවමාරු කිරීමට එකඟ විය. මෙහිදී ගවයින් පවුම් 192 කට අගය කළ අතර බාර්ලි පවුම් 215 කට අගය කොට හිඟය මුදලින් පියවීමට එකඟ විය. ගිවිසුම තුළ මුදල් ප්‍රතිෂ්ඨාවක් පවතින නිසා මෙම ගිවිසුම භාණ්ඩ විකිණීමේ විසුමක් ලෙස අධිකරණය තීරණය කරන ලදී.

**භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මිල තීරණය කරනු ලබන ආකාරය**

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාව පහත ආකාරයට තීරණය කළ හැකිය.

**01 ගිවිසුමේ මිල සඳහන් කර ඇත්නම් එසේ සඳහන් කර ඇති මිල.**

උදාහරණ - තේ අලෙවිකරුවෙකු වන පිලපිටිය මහතා තේ කිලෝ සීයක් කිලෝ එකක් රුපියල් දහස බැගින් විකිණීමට පෙරේරාට පොරොන්දු වීම.

**02 මිල තීරණය කරන ආකාරය ගිවිසුමේ සඳහන් කර ඇති විට පාර්ශවකරුවන් එකඟ වී ඇති ආකාරයට තීරණය කරනු ලබන මිල.**

උදාහරණ - පිලපිටිය මහතා සිය තේ කර්මාන්තශාලාවේ තේ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කළ මෝටර් රථයක් මිලට ගැනීමට එකඟවීම හා තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කිරීමෙන් අනතුරුව තක්සේරු වටිනාකම මිල වශයෙන් ගෙවීමට එකඟ වීම.

**03 පාර්ශවකරුවන් ව්‍යාපාර කටයුතු අතර මිල නියම කරනු ලබන ක්‍රමවේදයක් වේ නම් ඒ අනුව නියම කරන මිල.**

උදාහරණ - පිලපිටිය මහතා සිය තේ කර්මාන්තශාලාවේ තේ ගැණුම්කරු වෙත දිනපතා අලෙවි කරයි නම් හා එම තේ මිල නියම කරනු ලබන්නේ කොළඹ තේ වෙන්දේසියේ මිල මත පදනම්ව නම් එසේ ගණනය කරනු ලබන මිල.

**04 ඉහත කිසිවක් නොවේ නම් ගැණුම්කරු විසින් සාධාරණ මිලක් ගෙවිය යුතුය.**

**භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති කර ගැනීම හා එහි විධිමත්භාවය**

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 4 වන වගන්තිය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති කර ගැනීම පිළිබඳව ප්‍රතිපාදන සපයන අතර භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති කර ගැනීම පිළිබඳ සුවිශේෂී විධිමත්භාවයන් කිසිවක් එම වගන්තිය මගින් නොදක්වයි. ඒ අනුව ලිඛිතව, වාචිකව, කොටසක් වාචිකව හා කොටසක් ලිඛිතව සහ පාර්ශවයන්ගේ එකඟතාවයෙන් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති කරගත හැකි බව කල හැකි බව එම වගන්තිය දක්වයි.

කෙසේ නමුත් පනතේ 05 වන වගන්තිය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් බලාත්මක කිරීම පිළිබඳ ප්‍රතිපාදන දක්වන අතර එහිදී කියා සිටින්නේ ලිඛිත එකඟතාවයක් නොමැති ගිවිසුම් බලාත්මක කළ හැක්කේ පාර්ශවයන් අතර භාණ්ඩ සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් හෝ එසේත් නැතිනම් මිල සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් හෝ හුවමාරු වී ඇත් නම් පමණක් වන බවයි. ඒ අනුව අධිකරණය ඉදිරියේ බලාත්මක කර ගැනීමේ පහසුව උදෙසා භාණ්ඩ විකිණීමේ ගිවිසුම් ලිඛිතව ඇතිකර ගැනීම ඥානාන්විත වේ.

**භාණ්ඩ විකිණීමේ ගිවිසුම් අනෙකුත් ගිවිසුම්වලින් වෙන් කොට හඳුනා ගැනීම**

මෙහිදී භාණ්ඩ විකිණීමේ ගිවිසුම් අනෙකුත් ඒ සමාන ලක්ෂණ පවතින ගිවිසුම්වලින් වෙන්කොට හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

**වැඩ සහ ද්‍රව්‍ය සඳහා වන ගිවිසුම්**

වැඩ සහ ද්‍රව්‍ය සදහා වන ගිවිසුම් භාණ්ඩ විකිණීමේ ගිවිසුම්වලින් වෙන්කොට හඳුනා ගැනීම තරමක් අපහසු කාර්යයක් වුවද ඒ සම්බන්ධ යම් මාර්ගෝපදේශන සපයා ගත හැකිය. භාණ්ඩ විකිණීමේ ගිවිසුමකදී මූලිකවම භාණ්ඩයක අයිතිය විකුණුම්කරු විසින් පැවරීම ගණුදෙණුකරු අපේක්ෂා කරන අතර විකුණුම්කරුගේ යම් නිපුණතාවයක හෝ හැකියාවක බලපෑම

ගණුදෙණුකරු අපේක්ෂා නොකරයි. කෙසේ නමුත් වැඩ සහ ද්‍රව්‍ය සඳහා වන ගිවිසුමකදී ගැණුම්කරු භාණ්ඩ භාරදීමට අමතරව ගිවිසුම තුළ භාණ්ඩ භාර දෙනු ලබන පාර්ශවයකගේ යම් නිපුණතාවයක, කායික ශක්තියක හෝ හැකියාවක බලපෑම අපේක්ෂා කරනු ලබයි.

Lee V Griffin නඩුවේදී වෛද්‍යවරයෙකු කෘතීම දත් කුට්ටමක් සාදා දීමට එකඟ වූ ගිවිසුමක්ද, Robinson V Grave නඩුවේදී චිත්‍ර ශිල්පියෙකු විසින් කැන්වස් මත චිත්‍රයක් ඇඳ දීමට ඇති වූ ගිවිසුමක්ද, Lawrence v. Ytla හිදී ඡායාරූප ලබාගෙන දීමට ඡායාරූප ශිල්පියෙකු සමඟ ඇති කරගත් ගිවිසුමක්ද භාණ්ඩ විකිණීමේ ගිවිසුම් නොවන බව අවධාරණය කර ඇත. මෙම නඩු තීන්දු දෙස අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ සෑම අවස්ථාවකදීම භාණ්ඩයට අමතරව සපයන්නාගේ යම් නිපුණතාවයක් හෝ හැකියාවක් කෙරෙහි ගැණුම්කරු අවධානය යොමු කර ඇති බවයි.

## කුලී සින්නක්කර ගිවිසුම්

භාණ්ඩයක අයිතිය පැවරීමක් හෝ පැවරීමට එකඟවීමක් පැවතීම භාණ්ඩ විකිණීමේ ගිවිසුමක අත්‍යාවශ්‍ය අංගයකි. එම අයිතිය පැවරීම හෝ පැවරීමට එකඟවීම කොන්දේසිවලට යටත් නොවන නමුත් කුලී සින්නක්කර ගිවිසුමකදී කුලී ගැණුම්කරු විසින් නියමිත වටිනාකමක් ගෙවූ පසු අයිතිකරු දේපළ පැවරීමට එකඟව දේපළ කුලියට ලබා දීමක් සිදු වේ. කුලී වාරික නිසි පරිදි නොගවන්නේ නම් දේපළ නැවත සන්තකයට ගැනීමට කුලියට දෙන්නාට හැකියාව පවතී. ඒ අනුව කුලී සින්නක්කර ගිවිසුමක පවතිනුයේ කොන්දේසි සහගත පැවරීමකි. භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ දක්වා ඇති භාණ්ඩ විකිණීමේ ගිවිසුම යන නිර්වචනය හා කුලී සින්නක්කර ගිවිසුම් එකඟ නොවේ. එම නිසා කුලී සින්නක්කර ගිවිසුම් පාලනය වනුයේ 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ ප්‍රතිපාදන වලිනි.

## භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ව්‍යංග කොන්දේසි හා ප්‍රතිඥාභාර

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 13 සිට 16 දක්වා වගන්ති මගින් ව්‍යංග කොන්දේසි 5ක් සම්බන්ධයෙන් හා ප්‍රතිඥාභාර දෙකක් සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයට ප්‍රතිපාදන සපයයි. වෙනත් ආකාරයක එකඟත්වයක් නොමැති විට මෙම ව්‍යංග කොන්දේසි සෑම භාණ්ඩ විකිණීමේ ගිවිසුමකටම අදාළ වේ.

## භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ව්‍යංග කොන්දේසි

### 01 විකුණුම්කරුට විකුණනු ලබන භාණ්ඩ විකිණීමට අයිතියක් තිබිය යුතුය

භාණ්ඩ විකිණීමේ ආඥා පනත 13 (1) වගන්තිය අනුව, එකී භාණ්ඩ විකිණීමේ ගිවිසුම විකිණීමක් නම් ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී ද

එකී භාණ්ඩ විකිණීමේ ගිවිසුම විකණීමට එකඟ වීමක් නම් භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට මාරු වන අවස්ථාවේ දී ද විකුණුම්කරුට භාණ්ඩ විකිණීමට අයිතියක් තිබිය යුතුය.

භාණ්ඩ විකිණීමට ඇති අයිතිය යන්නෙන් භාණ්ඩයක හිමිකරු වීම අදහස් නොවන අතර භාණ්ඩයක් විකිණීමේ අයිතිය භාණ්ඩයේ හිමිකරුට, ඔහුගේ නියෝජිතයාට හෝ වෙනත් යම් අයිතියක් යටතේ විකුණන්නෙකු (උදා -බැංකු මඟින් සින්න වූ රත්‍රං බඩු වෙන්දේසි කිරීම) වෙත පැවතිය හැකිය.

යම් විකුණුම්කරුවෙක් තමාට විකිණීමට අයිතියක් නැති භාණ්ඩ විකුණා ඇති අවස්ථාවකදී ගැණුම්කරුට වන්දි ගෙවීමට විකුණුම්කරු බැඳේ.

Roland Vs Diwall

මෙම නඩුවේ දී A ගේ මෝටර් රථය B සොරකම් කරගෙන C ට විකුණු අතර C විසින් සද්භාවයෙන් වටිනාකමක් සඳහා මිලට ගන්නා ලදී. ඉන්පසු C විසින් D ටද D විසින් E ටද විකුණන ලදී. මාස කිහිපයකට පසුව පොලිසිය විසින් එම මෝටර් රථය E ගෙන් ලබා ගෙන නියම අයිතිකරුට භාර දෙන ලදී. D විසින් විකුණුම් මිල E හට ආපසු ගෙවන ලදී. එහෙත් C විසින් විකුණුම් මිල D ට ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. C ගෙන් මිල අය කර ගැනීම සඳහා D විසින් පැවරූ මෙම නඩුවේ දී අධිකරණය ප්‍රකාශ කළේ විකුණුම්කරුට C මෙම මෝටර් රථය B ගෙන් සද්භාවයෙන් මිලට ගෙන ඇත්තේ වුව ද B ට නිසි අයිතියක් නොපවතින බැවින් C ට ද නිසි අයිතියක් මිලදී ගැනීම මත හිමි නොවන බවයි. ඒ අනුව C ට මෙම මෝටර් රථය D වෙත විකිණීමට අයිතියක් නොපවතින බවත්, විකුණුම්කරුට විකිණීමට අයිතියක් තිබිය යුතුය යන ව්‍යංග කොන්දේසිය C විසින් උල්ලංඝනය කර ඇති නිසා C විසින් සම්පූර්ණ විකුණුම් මිල කිසිදු මිල අඩු කිරීමක් නොකොට D වෙත ගෙවිය යුතු බවත් අධිකරණය තීරණය කරන ලදී.

කෙසේ නමුත් භාණ්ඩ විකුණුම්කරුට භාණ්ඩ විකිණීමට නිසි අයිතියක් නොමැති බව දනිමින් ගැණුම්කරු ගිවිසුමට එළඹියේ නම් ගැණුම්කරුට මෙම ව්‍යංග වගන්තියේ රැකවරණය හිමි නොවේ.

Payne V Elsden (1900) 17 TLR 161

මෙම නඩුවේදී විකුණුම්කරු තාවකාලික භුක්තියක් තමාට හිමි වූ පියානෝවක් විකුණන ලදී. කෙසේ නමුත් ගැණුම්කරු පියානෝව සම්බන්ධව විකුණුම්කරුට පවතින්නේ තාවකාලික භුක්තියක් බව දැන සිටියේය. ඒ අනුව අධිකරණය ප්‍රකාශ කළේ ගැණුම්කරුට මෙම ව්‍යංග කොන්දේසියේ රැකවරණය හිමි නොවන බවයි.

### 02 භාණ්ඩ විස්තරයක් අනුව විකුණන්නේ නම් විකුණනු ලබන භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතුය

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 14 වන වගන්තිය අනුව 'විකුණුම්කරු විස්තරයක් අනුව භාණ්ඩ විකුණනු ලබයි නම්, එම භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතුය'. ඒ අනුව විකුණුම්කරු භාණ්ඩ විකුණන විට ප්‍රමාණය, ගුණාත්මකභාවය, වර්ණය, අඩංගු දේවල්, නිෂ්පාදනය කළ දිනය, කල් ඉකුත්වීමේ දිනය යනාදිය සම්බන්ධයෙන් විස්තර කර භාණ්ඩ විකුණනු ලබයි නම් විකුණුම්කරු විකුණනු ලබන භාණ්ඩ එකී විස්තරයට අනුකූල විය යුතුය. එසේ නොවන විටක මෙම ව්‍යංග කොන්දේසිය කඩ කරයි.

Beale V Taylor (1967) 1 WLLR 1193

මෙම නඩුවේදී 1961 මාදිලියේ ට්‍රයම්ප් හෙරල්ඩ් 1200 වර්ගයේ මෝටර් රථයක් විකිණීමට තිබෙන බවට පුවත්පතක පළ කරන ලද දැන්වීමක් අනුව මෝටර් රථයක් අලෙවි කරන ලදී. ගැණුම්කරු විසින් එය මිල දී ගැනීමෙන් පසුව දැනගන්නට ලැබුණේ එය ට්‍රයම්ප් හෙරල්ඩ් 1200 වර්ගයට අයත් මෝටර් රථයක් නොවන බවයි. ඒ අනුව අධිකරණය භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතුය යන ව්‍යංග වගන්තිය උල්ලංඝණය කර ඇති බව තීරණය කරන ලදී.

Varley V Whip (1900) 1 QB 516

මෙම නඩුවේදී පාවිච්චි කරන ලද අස්වැන්න නෙලීමේ යන්ත්‍රයක් මිලට ගැනීමට එකඟ විය. කෙසේ නමුත් විකුණුම්කරු ප්‍රකාශ කළේ එය අලුත් තත්වයේ පවතින එකක් බවයි. කෙසේ නමුත් එම යන්ත්‍රය පසුගිය වසර දෙකක් දැඩි ලෙස භාවිතයට ගත් යන්ත්‍රයක් විය. ඒ අනුව විකුණන ලද භාණ්ඩ විස්තරයට අනුකූල නොවන බව අධිකරණය ප්‍රකාශ කරන ලදී.

Wallis V Pratt (1911) AC 394

මෙම නඩුවේදී බීජ වර්ග අලෙවිය පිළිබඳ ගැටුවක් මතුවිය. බීජ අලෙවිකරු ඉංග්‍රීසි සෙන්ෆොයින්

බීජ බව පවසමින් බීජ අලෙවිකරන ලදී. නමුත් එම බීජ වර්ධනය වීමේදී අනාවරණය වූයේ එම බීජ යෝධ සෙන්ෆොයින් බවයි. අධිකරණය ප්‍රකාශ කළේ භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතුය යන ව්‍යංග වගන්තිය විකුණුම්කරු විසින් උල්ලංඝණය කර ඇති බවයි.

අධිකරණය විසින් මෙම ව්‍යංග කොන්දේසිය දැඩිව අර්ථ නිරූපනය කර ඇති බව ඇතැම් නඩු තීන්දු අධ්‍යයනයේදී පෙනී යයි.

Re moore landeure (1921) 2 KB 519

මෙහිදී විකුණුම්කරු පළතුරු ඇසුරූ ටින් 3100 ක් 30 බැගින් අසුරූ පෙට්ටිවල දමා විකිණීමට එකඟ විය. කෙසේ නමුත් පළතුරු ඇසුරූ ටින් 3100 න් ඇතැමක් 24 බැගින් වූ පෙට්ටිවලටද ඉතිරිය 30 බැගින් වූ පෙට්ටිවලට දමා ගැණුම්කරු වෙත යවා තිබුණි. ගැණුම්කරු අපේක්ෂා කළ ආකාරයට භාණ්ඩ අසුරා නොතිබීම නිසා ගැණුම්කරු භාණ්ඩ ප්‍රතික්ෂේප කරන ලදී. මේ සම්බන්ධ නඩුවේදී විකුණුම්කරු වෙනුවෙන් කියා සිටියේ 24 බැගින් අසුරා ඇති පෙට්ටි 30 බැගින් අසුරා ඇති පෙට්ටිවලට වටිනාකමෙන් සමාන බවයි. කෙසේ නමුත් අධිකරණය ප්‍රකාශ කළේ භාණ්ඩ වටිනාකමෙන් සමාන වුවද ඇසුරුම් සම්බන්ධයෙන් කරන ලද විස්තරයට අනුකූල නොවන නිසා එම භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ගැණුම්කරු සතු බවයි.

Acros Ltd V Ronasen & Son (1933) AC 470

මෙහිදී ගැණුම්කරු අඟල් භාගයක ඝනකම සහිත දැව තොගයක් මිලදී ගැනීමට එකඟ විය. විකුණුම්කරු සපයන ලද දැව ගැණුම්කරුගේ කාර්යය සඳහා යෝග්‍ය වුවද අඟල් භාගයට වඩා ඝනකම සුලු ප්‍රමාණයකින් වෙනස් විය. මෙහිදී අධිකරණය තීරණය කළේ විස්තරයට අනුකූල විය යුතුය යන ව්‍යංග වගන්තිය උල්ලංඝණය කර ඇති බවයි. තව දුරටත් අධිකරණය මෙම වගන්තිය අර්ථ නිරූපනය කරමින් කියා සිටියේ ටොන් එකක් යන්නෙන් ටොන් එකක් පමණ යන්න අදහස් නොවන බවත් යාරයක් යන්නෙනන් යාරයක් පමණ අදහස් නොවන බවත් අඟල් භාගයක් යන්නෙන් අඟල් භාගයක් පමණ යන්න අදහස් නොවන බවයි. ඒ අනුව විස්තරය හා ඉතා කුඩා ප්‍රමාණයකින් අනුගත නොවුනද මෙම ව්‍යංග වගන්තිය උල්ලංඝණය වූවා සේ සැලකේ.

තවදුරටත් භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 14 වන වගන්තිය දක්වන්නේ 'විකුණුම්කරු භාණ්ඩ විකුණනු ලබන්නේ විස්තරයක් සහ නියැදියක් අනුව නම් විකුණුම්කරු විකුණනු ලබන භාණ්ඩ විස්තරයට සහ නියැදියට යන දෙකටම අනුකූල විය යුතු බවයි'.

Nichol V Godts [1933]

මෙහිදී සාම්පලයකට අනුව තෙල් තොගයක් විකිණීමට එකඟ වූ අතර එම තෙල් විදේශයකදී පෙරන ඒවා බව ප්‍රකාශ කරන ලදී. තෙල් තොගය සාම්පලය හා සමාන වුවද ඒවා විදේශයකදී පෙරන ලද තෙල් නොවන බව අනාවරණය විය. අධිකරණය මෙහිදී ප්‍රකාශ කළේ විස්තරයට අනුරූප නොවන නිසා විස්තරයට අනුකූල විය යුතුය යන ව්‍යංග කොන්දේසිය උල්ලංඝණය වී ඇති බවයි.

### 03 භාණ්ඩ ගැණුම්කරුගේ අවශ්‍යතාවයට සුදුසු විය යුතුය

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 15(1) වගන්තිය අනුව,'විකුණුම්කරු භාණ්ඩ විකුණනු ලබන්නේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර නම් විකුණුම්කරුගේ නිපුණතාවය හා විනිශ්චය කෙරෙහි විශ්වාසය තබමින් ගැණුම්කරු තමාට භාණ්ඩ අවශ්‍ය කාරණය විකුණුම්කරු හට ප්‍රකාශිත හෝ ව්‍යංගයෙන් සඳහන් කරයි නම් විකුණුම්කරු විකුණනු ලබන භාණ්ඩල ගැණුම්කරුගේ අවශ්‍යතාවයට සුදුසු විය යුතුය'. විකුණුම්කරු නිෂ්පාදකයා වුව ද, නොවුවද, මෙම ව්‍යංග කොන්දේසියෙන් වගකීමට බැදේ.

- විකුණුම්කරු මෙම ව්‍යංග කොන්දේසියෙන් වගකීමට බැඳීමට නම් පහත සඳහන් කරුණු සනාථ විය යුතුය.
- විකුණුම්කරු සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර භාණ්ඩ විකුණා තිබිය යුතුය.
- ගැණුම්කරු විසින් ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් භාණ්ඩවල අවශ්‍යතාවය විකුණුම්කරුට අනාවරණය කර තිබිය යුතු ය.
- ගැණුම්කරු විකුණුම්කරුගේ දක්ෂතාවය හා නිපුණතාවය මත විශ්වාසය තබා භාණ්ඩ මිලදී ගත් බව පෙනී යා යුතුයි.

කෙසේ වෙතත්

■ ගැණුම්කරු විසින් භාණ්ඩ ඉල්ලා ඇත්තේ එහි වෙළෙඳ නාමයෙන් ස්වාධිකර නාමයෙන් වන

විටක හෝ

■ ගැණුම්කරු විසින් තමාගේ නිපුණතාවය සහ විනිශ්චය කෙරෙහි විශ්වාසය තබා ඇති විටක

හෝ

■ විකුණුම්කරුගේ නිපුණතාවය සහ විනිශ්චය කෙරෙහි විශ්වාසය තැබීම අසාධාරණ වන විටක

මෙම ව්‍යංග කොන්දේසියේ අදාළත්වයක් නොමැත.

Frost V Aylesbury Diary Company Ltd (1905)

මෙහිදී විකුණුම්කරු විසින් විෂබීජ සහිත කිරි විකුණා තිබුණි. ඒවා මිල දී ගත් ගැණුම්කරු පාරිභෝජනය කළ විට ගැණුම්කරු මිය ගියේය. අධිකරණය ප්‍රකාශ කළේ කිරි අවශ්‍යතාවය සඳහා සුදුසු නොවන නිසාද, ගැණුම්කරුගේ අවශ්‍යතාවය ව්‍යංගව සන්නිවේදනය වී ඇති බැවින්ද විකුණුම්කරු අලාභ ගෙවීමට වගකීමට බැඳෙන බවයි.

Grant V Australian Knitting Mills Company (1936) AC 85

මෙහිදී විකුණුම්කරු විසින් විකුණන ලද යට ඇඳුම් ගැණුම්කරු පැළඳි විට චර්ම රෝගයකට භාජනය විය. අධිකරණය ප්‍රකාශ කළේ විකුණුම්කරු සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර විකිණීම කර ඇති නිසා භාණ්ඩවල අවශ්‍යතාවය ව්‍යංගයෙන් අදහස් වන හෙයින්ද, විකුණුම්කරු විකුණන ලද භාණ්ඩ ගැණුම්කරුගේ අවශ්‍යතාවය සඳහා සුදුසු නොවන බවයි.

ipc.elearning.lk®

Baldry V Marshall (1925) 1 KB 260

මෙම නඩුවේ දී ගැණුම්කරු සංචාරය සඳහා සුදුසු සැප වාහනයක් ඉල්ලා සිටි විටදී වේගවත් ක්‍රිඩාවට උචිත බුගාටි වර්ගයේ මෝටර් රථයක් ලබා දෙන ලදී. ඒ අනුව අධිකරණය තීරණය කළේ මෙම මෝටර් රථය අවශ්‍යතාවයට නොගැලපෙන බවයි.

### 04 භාණ්ඩ වෙළෙඳ තත්වයේ තිබිය යුතුය

භාණ්ඩ විකිණීමේ ආඥා පනත 15 (2) වගන්තිය අනුව, 'විකුණුම්කරු සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර භාණ්ඩ විකිණීම කරනු ලබයි නම් විකුණුම්කරු විකුණනු ලබන්නා වූ භාණ්ඩ වෙළෙඳ තත්වයේ තිබිය යුතුය'.

<u>වෙළෙඳ තත්වය යනු කිසියම් භාණ්ඩයක් සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගනු ලබන්නේ කිසියම් අරමුණක් සඳහා ද, එම අරමුණ සඳහා භාවිතා කළ හැකි වීමයි.</u> වෙළෙඳ තත්වය සාධාරණ කාලයක් තිබිය යුතුය. භාණ්ඩය සඳහා බලපාන ගැරන්ටි කාල සීමාවක් පැවතීම මෙම කොන්දේසිය අදාළ වීමේදී බල නොපායි. ගැරන්ටි කාල සීමාවක් රහිත භාණ්ඩ සම්බන්ධයෙන්ද

මෙම ව්‍යංග වගන්තිය අදාළ වේ. විකුණුම්කරු නිෂ්පාදකයා වුව ද, නොවූව ද, මෙම ව්‍යංග කොන්දේසියෙන් වගකීමට බැදේ. තවද භාවිතා කරන ලද භාණ්ඩයක් සම්බන්ධයෙන් වුවද මෙම ව්‍යංග වගන්තිය අදාළ වේ.

G. W. P. Gunawardena V Ceylon Steel Corporation Oruwala CA 906/1993

මෙම නඩුවේදී ගැණුම්කරු විසින් වී තම්බන හා වේලන යන්ත්‍රයක් මිලට ගත් නමුත් එම යන්ත්‍රය

නිසි පරිදි ක්‍රියාත්මක නොවූ අතර තම්බන හා වේලන ලද හාල් වර්ණය වෙනස් වීම, අපිරිසිදු වීම වැනි තත්වයන්ට ලක් විය. ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණය මේ සම්බන්ධයෙන් කියා සිටියේ යන්ත්‍රය වෙළඳ තත්වයේ නොමැති බවයි.

Howell V Coupland (1921) 1 Ch 606

මෙම නඩුවේදී ගැණුම්කරු විසින් මාලු අලෙවිකරුවෙක්ගෙන් අලුත් කකුලුවන් ඉල්ලා සිටි අතර අලුත් කකුලුවන් තමා සතු නොවන බැවින් තම්බන ලද කකුලුවන් විකුණන ලදී. එම තම්බන ලද කකුලුවන් ආහාරයට ගැනීම නිසා ගැණුම්කරු රෝගාතුර වූ අතර අධිකරණය ඒ සම්බන්ධයෙන් කියා සිටියේ විකුණන ලද භාණ්ඩ වෙළඳ තත්වයේ නොමැති බවයි.

Wren V Holt (1903) 1 KB 610

මෙම නඩුවේදී විකුණන ලද බියර්වල ආසනික් අන්තර්ගත විය. අධිකරණයේ මතය වූයේ බියර් අවශ්‍යතාවයට නොගැලපෙනවා මෙන්ම වෙළඳ තත්වයේ ද නොමැති බවයි.

භාණ්ඩයක දෝෂ පවතින පමණින්ම එය වෙළඳ ගුණයෙන් තොර බව අර්ථ නිරූපණය කළ නොහැකිය. මෙම ව්‍යංග කොන්දේසියේ අදාළත්වය වටහා ගැනීම සඳහා වෙළඳ ගුණය යන්න මැනවින් වටහා ගත යුතුය. භාණ්ඩයක දෝෂ තිබුණද එම භාණ්ඩය එකී සාමාන්‍ය භාවිත අරමුණ සඳහා භාවිතා කිරීමට එම දෝෂය හේතු නොවේ නම් වෙළඳ ගුණය බිඳ නොවැටන බව අධිකරණය විසින් තීරණය කොට ඇත.

Millars of Falkirk Ltd V Turpie 1976

මෙම නඩුවේදී මෝටර් රථයක සුක්නාමෙන් සිදු වූ කුඩා ලිහිසි තෙල් කාන්දුවක් මෝටර් රථයේ වෙළඳ ගුණයට බාධාවක් නොවන බව අධිකරණය විසින් තීරණය කරන ලදී.

කෙසේ වෙතත් වෙළෙඳ තත්වයේ පැවතීම සම්බන්ධයෙන් වන ඉහත ව්‍යංග කොන්දේසිය සඳහා ව්‍යතිරේඛ දෙකක් තිබේ. එනම්,

■ ගැණුම්කරු භාණ්ඩ පරීක්ෂාකර ඇති විටක දී සාධාරණ පරීක්ෂාවක දී අනාවරණය කර ගත හැකි දෝෂ සම්බන්ධයෙන් විකුණුම්කරු වගකීමෙන් නිදහස් වේ.

Thornett & Fehr V Beers & Son

මෙම නඩුවේ විෂය වස්තුව වූයේ ගම්ය. මිලට ගැනීමට ප්‍රථම ගැණුම්කරු විසින් ගම් පරීක්ෂා කර තබුණි. ගම් පරීක්ෂා කර තිබුණේ ඒවා පිටතින් බැලීමෙන් මිස ඇතුළත බැලීමෙන් නොවේ. නිවසේ දී ඒවා විවෘත කළ විට ඔහුට දැකගත හැකි වූයේ ඒවායේ තිබුණු ගම් ඝන වී තිබූ බවයි. අධිකරණය ප්‍රකාශ කළේ ගැණුම්කරු භාණ්ඩ පරීක්ෂා කර තිබූ නිසා එම භාණ්ඩ වෙළඳ තත්වයේ නොමැති වුවද විකුණුම්කරු වෙත වගකීම් පැවරිය නොහැකි බවයි.

■ භාණ්ඩවල තිබෙන්නා වූ දෝෂ විකුණුම්කරු විසින් ගැණුම්කරුට අනාවරණය කර ඇති විටක.

### 05 නියැදියක් අනුව භාණ්ඩ විකුණා ඇති විටකදී විකුණන ලද භාණ්ඩ නියැදියට අනුකූල විය යුතුය

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 16 වන වගන්තිය අනුව, 'විකුණුම්කරු භාණ්ඩ විකුණනු ලබන්නේ නියැදියක් අනුව නම් විකුණුම්කරු සපයනු ලබන භාණ්ඩ නියැදියට අනුකූල විය යුතුය'. එහිදී,

■ මුළු තොගය නියැදිය සමඟ සැසඳීම සඳහා ගැනුම්කරුට සාධාරණ කාලයක් හිමිවිය යුතුය.

■ නියැදියේ තිබුණා වු දෝෂ හැර වෙනත් දෝෂ කිසිවක් මුළු තොගයේ නොතිබිය යුතුය.

■ සමස්තයක් වශයෙන් සලකා බලන කළ මුළු තොගය නියැදියට අනුකූල විය යුතුය.

සාධාරණ නියැදි පරීක්ෂාවකදී හඳුනාගත නොහැකි දෝෂ තොගයේ පවතී නම් භාණ්ඩය නියැදිය හා සම වුවද වෙළඳ තත්වයේ නොමැති වීම මත විකුණුම්කරු චෝදනාවට ලක් කළ හැකිය.

Drummond V Van Ingen

මෙම නඩුවේදී රෙදි තොගයක් සාම්පලයකට අනුව විකුණන ලදී. රෙදි තොගය සාම්පලයට අනුකූල වුවද සාධාරණ පරීක්ෂාවකට හසු නොවන දෝෂ රෙදි තොගයේ පැවතීම නිසා මැසීමට

නුසුදුසු තත්වයේ පැවතුණි. අධිකරණය ප්‍රකාශ කළේ භාණ්ඩ තොගය නියැදියට අනුකූල වුවද වෙළඳ ගුණයෙන් යුක්ත නොවන බවයි.

## භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග ප්‍රතිඥාභාර

1. භාණ්ඩ විකිණීමේ ආඥා පනත 13(2) උපවගන්තිය මගින් සඳහන් කරන්නේ "ගැණුම්කරු හට භාණ්ඩ සම්බන්ධයෙන් නිරවුල් භුක්තියක් හිමි විය යුතු බවයි." එනම් ගැණුම්කරු හට භාණ්ඩ භුක්ති විඳීම සඳහා විකුණුම්කරු බාධා නොවිය යුතුය. ගැණුම්කරුට භාණ්ඩ භුක්ති විඳීමට විකුණුම්කරු බාධා කළ විට විකුණුම්කරු විසින් මෙම ප්‍රතිඥාභාරය කඩ කළා සේ සැලකේ. එවන් අවස්ථාවක ගැණුම්කරු සතු එකම ප්‍රතිකර්මය වනුයේ සිදු වූ අලාභය විකුණුම්කරුගෙන් අය කරගැනීමයි.

2. භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 13(3) උප වගන්තිය සඳහන් කරන්නේ "ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී අනාවරණය කර ඇති තාක් දුරට හැරුණු විටකල ගැණුම්කරුට භාණ්ඩ භුක්ති විඳීමට තෙවන පාර්ශවයක් බාධා නොකළ යුතු බවයි." එම නිසා ගැණුම්කරුට භාණ්ඩ භුක්ති විඳීම සඳහා තෙවන පාර්ශවයක් බාධා කරනු ලැබුවහොත් ගැණුම්කරුට සිදු වූ අලාභ විකුණුම්කරුගෙන් ගැණුම්කරුට අයකර ගත හැකිය.

## භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසි කඩවීම ව්‍යංග ප්‍රතිඥාභාර කඩවීමක් සේ සැලකීම

<u>භාණ්ඩ විකිනීමේ අඥා පනතේ 12(3) වගන්තිය අනුව භාණ්ඩ විකිණීමට අදාළ ව්‍යංග කොන්දේසියක් කඩ වී ඇත්තේ වුවද එම භාණ්ඩ ගැණුම්කරු භාරගෙන තිබේ නම් එතැන් සිට එම කොන්දේසිය කඩ වීම සැලකිය හැක්කේ ප්‍රතිඥාභාරයක් කඩ වීමක් සේ පමණි.</u> ඒ අනුව භාණ්ඩ භාර ගැනීමෙන් පසු ව්‍යංග කොන්දේසි කඩවීම මත භාණ්ඩ ප්‍රතික්ෂේප කරමින් ආපසු යැවීමට ගැණුම්කරුට හැකියාවක් නොමැති අතර ඔහුට ඇති එකම ප්‍රතිකර්මය බවට පත්වනුයේ භාණ්ඩ විකිණීමේ ගිවිසුම කඩවීම සම්බන්ධයෙන් අලාභ ඉල්ලා සිටීම පමණි.

## විකුණුම්කරුගෙන් ගැණුම්කරුට භාණ්ඩවල අයිතිය මාරු වීම

භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරු වෙත මාරු වීම භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මූලිකාංගයකි. මෙම අයිතිය මාරු වන අවස්ථාව කුමක්ද යන්න හඳුනා ගැනීම භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ඉතා වැදගත් කරුණකි. මන්දයත් භාණ්ඩයක අවදානම හා ප්‍රතිලාභ, අයිතිය හා බැඳී තිබෙන බැවින් එකී ප්‍රතිලාභ හා අවදානම් පාර්ශවයන් අතර හුවමාරු වනුයේ අයිතිය මාරුවන

අවස්ථාවේදීමය. එසේම පාර්ශවයන් සතු ප්‍රතිකර්ම අයිතිය මාරු වීම හා බැඳී තිබේ. ගැණුම්කරුවා වෙත භාණ්ඩයක අයිතිය මාරු වී ඇත් නම් ඔහුට හිමි වනුයේ විකුණුම්කරුට එරෙහි පුද්ගලික ප්‍රතිකර්ම පමණි ඔහුට භාණ්ඩවලට එරෙහි ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීමට ඇති නීතිමය අයිතිය අහෝසි වී යයි. අනෙක් අතට භාණ්ඩවල අයිතිය මාරු වී ඇති අවස්ථාවක විකුණුම්කරුට නැවත භාණ්ඩ වල සන්තකය ලබා ගත නොහැකිය. ඔහුද ගැණුම්කරුට එරෙහිව පුද්ගල ප්‍රතිකර්ම ක්‍රියාත්මක කල යුතුය. ඒ අනුව මෙම පරිච්ඡේදය තුළ භාණ්ඩ විකිණීමේ ගණුදෙණුවකදී එකී භාණ්ඩයේ අයිතිය හුවමාරු වන නිශ්චිත අවස්ථාව කුමක්ද හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි.

<u>භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 18 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව නිශ්චිත භාණ්ඩයක අයිතිය හුවමාරු විය යුත්තේ පාර්ශවයන්ගේ චේතනාව අනුවය.</u> පාර්ශවයන්ගේ චේතනාව

- ගිවිසුමේ වගන්ති
- පාර්ශවයන්ගේ හැසිරීම
- නඩුවේ අවස්ථානු ගත කරුණු මත තීරණය කළ යුතු බව පනතේ 18(2) වගන්තිය දක්වා ඇත.

ipc.elearning.lk®

Dennant V Skinner and Collon (1948) 2 KB 164

මෙම නඩුවේදී පැමිණිලිකරු මෝටර් රථයක් අලෙවි කළ අතර ගැණුම්කරු චෙක්පතක් ලබා දී මෝටර් රථය රැගෙන යාමට ඉල්ලා සිටියේය. විකුණුම්කරු ඊට ඉඩ ලබා දුන්නද චෙක්පත මුදල් වනතුරු අයිතිය මාරු නොවන බවට ගිවිසුමේ ප්‍රතිපාදන ඇතුලත් කරන ලදී. චෙක්පත අගරු වීම මත මෝටර් රථය නැවත ලබා ගැනීමට විත්තිකරුට විරුද්ධව පැවරූ නඩුවේදී අධිකරණය කියා සිටියේ අයිතිය මාරු වන්නේ කවර අවස්ථාවේදීද යන්න පිළිබඳව පාර්ශවකරුවන්ගේ චේතනාව පැහැදිලි නිසා මෝටර් රථයේ අයිතිය පැමිණිලිකරුගෙන් වෙනත් පාර්ශවයක් වෙත මාරු වී නොමැති බවයි. ඒ අනුව මෝටර් රථය ලබා ගැනීමට පැමිණිලිකාර විකුණුම්කරුට අයිතිය ඇති බව අධිකරණය නිගමනය කරන ලදී.

<u>කෙසේ නමුත් බොහෝ භාණ්ඩ විකිණීමේ ගිවිසුම්වලදී පාර්ශවකරුවන් අයිතිය මාරු වන අවස්ථාව කුමක්ද යන්න පිළිබඳව ප්‍රකාශිත එකඟතාවයකට නොඑළඹේ. එවන් අවස්ථාවලදී අයිතිය මාරු වීම පිළිබඳව පාර්ශවයන්ගේ චේතනාව හඳුනා ගැනීම සඳහා භාණ්ඩ විකිණීමේ අඥා පනත රීතීන් පහක් ඉදිරිපත් කොට තිබේ. ඉන් රීතීන් හතරක් නිශ්චිත භාණ්ඩ සම්බන්ධ වන අතර අවසන් රීතිය අවිනිශ්චිත භාණ්ඩ සම්බන්ධ වෙයි.</u>

ඒ අනුව භාණ්ඩයක අයිතිය මාරු වීමට අදාළ ප්‍රතිපාදන නිශ්චිත භාණ්ඩ හා අවිනිශ්චිත භාණ්ඩ සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කල හැකිය.

## නිශ්චිත භාණ්ඩවල අයිතිය මාරු වීම

### පළමු රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ භාර දිය හැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ නම් හා අදාළ ගිවිසුම කොන්දේසි විරහිත එකක් නම් ගිවිසුමට එළඹී වහාම භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට මාරු වේ.

මෙහිදී මතක තබා ගත යුතු වැදගත් කරුණක් වනුයේ භාණ්ඩයක අයිතිය මාරු වීම කෙරෙහි අන් ආකාරයකින් චේතනා කොට නොමැති නම් මුදල් ගෙවීම හෝ භාණ්ඩයේ සන්තකය ලබා ගැනීම යන කාරණා බල නොපාන බවයි.

Tarling V Baxter (1827) 6 KB 360

මෙම නඩුවේදී B නැමැත්තා A නැමැත්තාගෙන් කපා ගොඩ ගසා තිබූ පිදුරු තොගයක් මිලට ගන්නා ලදී. අදාළ පිදුරුවල මිල මාසයකින් ගෙවීමට එකඟ විය. B තමා පිදුරු ඉවත් කරගන්නා තෙක් A ගේ ඉඩමේ තිබෙන්නට හැරියේය. මේ අතර හදිසියේ හටගත් ගින්නකින් පිදුරු තොගය විනාශයට පත්විය. අධිකරණය ප්‍රකාශ කළේ පිදුරු භාර දිය හැකි තත්වයේ නිශ්චිත භාණ්ඩයක් වන නිසා ගිවිසුමට එළඹී වහාම පිදුරුවල අයිතිය B වෙත මාරු වී ඇති බවත්. එම නිසා B අලාභය දරා ගනිමින් පිදුරුවල මිල A ට ගෙවිය යුතු බවයි.

### දෙවන රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ භාර දිය නොහැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ නම්, ඒවා භාර දිය හැකි තත්වයට පත් කිරීමට බැඳී සිටින්නේ විකුණුම්කරු විසින් නම්, විකුණුම්කරු ඒවා භාර දිය හැකි තත්වයට පත් කොට ගැණුම්කරුට දන්වන තෙක් භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට මාරු නොවේ.

Underwood V Burgh Castle Brick and Cement Syndicate (1922) 1 KB 123

මෙම නඩුවේදී සිමෙන්ති පොළවක සවිකරන ලද යන්ත්‍රයක් විකිණීමට ගිවිසුමකට එළැඹිණි. ගිවිසුම ප්‍රකාරව විකුණුම්කරු විසින් මෙම යන්ත්‍රය සිමෙන්ති පාදමෙන් ගලවා දුම්රියට පැටවිය

යුතුය. සිමෙන්ති පාදමෙන් ගලවන තෙක් එම භාණ්ඩය භාර දිය හැකි තත්වයේ භාණ්ඩයක් නොවේ. දුම්රියට පටවන අවස්ථාවේදී භාණ්ඩයට හානි සිදු විය. අධිකරණය ප්‍රකාශ කළේ භාණ්ඩවල අයිතිය මාරු වී නොමැති නිසා විකුණුම්කරු අලාභය දරා ගත යුතු බවයි.

Philip Head & Sons Ltd V Showfronts (1970) 1 QB 140

මෙම නඩුවේදී ආයතනයක කාමර කිහිපයක ලෙදර් කාපට් එළීමට විකුණුම්කරු එකඟ විය. අදාළ

ආයතනයට කාපට් රෝල විකුණුම්කරු විසින් රැගෙන ආ අතර පසු දින එළීමේ කටයුතු කිරීමට කටයුතු යොදන ලදී. කෙසේ නමුත් එදින රාත්‍රියේ කාපට් රෝල සොරා ගන්නා ලදී. ඒ සම්බන්ධයෙන් අධිකරණය ප්‍රකාශ කළේ කාපට් එළීමට ඉතිරිව ඇති නිසා භාණ්ඩ භාර දිය නොහැකි තත්වයේ භාණ්ඩ වන බවත් අයිතිය විකුණුම්කරු සතු වන බවත් අලාභ ඔහු විසින්ම දරාගත යුතු බවත්ය.

## තෙවන රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ භාර දිය හැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ වුවද ඒවායේ මිල නියම කිරීමේ කාර්යය සඳහා විකුණුම්කරු විසින් කිරීම, මැනීම හෝ වෙනත් යම් ක්‍රියාවක් හෝ දෙයක් කළ යුතු වන විටක, විකුණුම්කරු එය සිදු කොට ගැණුම්කරුට දන්වන තෙක් භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට මාරු නොවේ. කෙසේ නමුත් භාණ්ඩවල මිල නියම කිරීම සඳහා ඒවා කිරීම්, මැනීම් හෝ වෙනත් යම් පරීක්ෂණ කළ යුතු වන්නේ ගැණුම්කරු විසින් වන විටක මෙම තෙවන රීතිය අදාළ නොවන අතර අදාළ වන්නේ පළමු රීතිය යි.

National Coal Board V Gamble (1959) 1 QB 11

මෙම නඩුවේදී ගල් අගුරු පතලෙන් ගැණුම්කරුගේ ලොරියට ගල් අඟුරු පටවා කිරා බැලීම සඳහා මඳ දුරකින් පිහිටි කාර්යාලයක් වෙත ගෙන යයි. එහිදී ගල් අගුරු කිරා රිසිට්පතක් ලබා දෙයි. අධිකරණය මේ සම්බන්ධව කියා සිටියේ ගල් අගුරුවල අයිතිය මාරු වනුයේ එය කිරා බලන අවස්ථාවේදී බවයි.

Truley V Bates

මෙම නඩුවේදී විකුණුම්කරු මැටි භාජන තොගයක් විකුණන ලදී. ගිවිසුම අනුව විකුණන ලද භාණ්ඩවල බර ප්‍රමාණය විකුණුම්කරු විසින් මැන බලා ගැණුම්කරුට දැන්විය යුතුය. කෙසේ

නමුත් එසේ බර ප්‍රමාණය නිශ්චය කිරීමට පෙර වර්ෂාවෙන් මැටි භාජනවලට හානි සිදුවිය. ඒ සම්බන්ධයෙන් අධිකරණයේ නිගමනය වූයේ මැටි භාජනවල අයිතිය මාරු වී නොමැති නිසා අලාභය විකුණුම්කරු විද දරාගත යුතු බවයි.

### සිව්වන රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ ගැණුම්කරුගේ "අනුමැතියට යටත්ව" හෝ" විකිණීමේ හෝ ආපසු ගෙවීමේ පදනම" මත හෝ වෙනත් ඒ හා සමාන නියමයක් යටතේ ගැණුම්කරුට භාණ්ඩ භාර දී ඇති විටෙක එකී භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට මාරුවන්නේ පහත සඳහන් අවස්ථාවන් යටතේ ය.

■ ගැණුම්කරුගේ අනුමැතිය හෝ පිළිගැනීම විකුණුම්කරුට දැන් වූ විට හෝ ගනුදෙනුව පිළිගන්නා වූ හෝ වෙනත් යම් ක්‍රියාවක් කළ විට (එම භාණ්ඩ වෙනත් අයෙකුට විකිණීම හෝ උකස් කිරීම වැනි ක්‍රියාවක් කිරීමෙන්)

Kirkham V Attenborough (1897) 1 QB 201

මෙහිදී දී P විසින් රන් ආභරණයක් විකිණීමේ හෝ අපසු එවීමේ පදනම මත A ට භාර දෙන ලද අතර A විසින් එම රන් භාණ්ඩ වෙනත් පාර්ශවයකට උගස් කරන ලදී. අනතුරුව A විසින් උගස්කරුගෙන් භාණ්ඩ ඉල්ලා පැවරූ නඩුවේදී අධිකරණය ප්‍රකාශ කළේ P තවදුරටත් භාණ්ඩවල අයිතිකරු නොවන බවයි. මන්දයත් උගස්තැබීම සමඟ P ගේ අයිතිය A වෙත පැවරෙන බැවිනි.

■ ගැණුම්කරු තමාගේ අනුමැතිය හෝ පිළිගැනීම විකුණුම්කරුට දැන්වීමක් නොකර භාර නොගන්නේ නම්, භාණ්ඩ ආපසු භාරදිය යුතු යැයි නියම කර ඇති නිශ්චිත වේලාවක් ඇත්නම්, එය ඉක්මවන තෙක් හෝ එසේ නිශ්චිත වේලාවක් නියම කර නැති විටෙක,සාධාරණ කාලසීමාවක් ඉක්මවන තෙක්, එම භාරයට තබා ගෙන සිටි විටෙක.

Poole V Smith's Car Sale

මෙම නඩුවේදී P විසින් තමාගේ කාරය විකිණීම හෝ නැවත භාරදීමේ කොන්දේසිය යටතේ D ට ලබා දුන්නේය. D විසින් දැඩි අලාභ හානි කරන ලද මෝටර් රථය මාස තුනකින් P වෙත එවන ලදී. මේ සම්බන්ධයෙන් අධිකරණය ප්‍රකාශ කළේ සාධාරණ කාලයක් තුළ කාර් රථය නැවත භාර නොදීම නිසා එහි අයිතිය D ට මාරු වන බවයි. ඒ අනුව කාර් රථයේ වටිනාකම D විසින් P ට ගෙවිය යුතු බව තීරණය කරන ලදී.

**අවිනිශ්චිත භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ වන රීතිය**

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 16 වන වගන්තියේ දක්වා ඇති මූලික රීතියක් ලෙස "අවිනිශ්චිත භාණ්ඩ වල අයිතිය මාරු නොවේ" යන රීතිය දක්වා ඇත. කෙසේ නමුත් 19 වන වගන්තියේ දක්වා ඇති පස්වන රීතිය අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වූයේ අවිනිශ්චිත භාණ්ඩයක් නම් එහි අයිතිය මාරු වනුයේ එම අවිනිශ්චිත භාණ්ඩ ගිවිසුමට අදාළව නිශ්චිතව හා කොන්දේසි විරහිතව වෙන්කළ විට පමණි. එහිදී අවිනිශ්චිත භාණ්ඩ නිශ්චිත ස්භාවයට පරිවර්තනය වීමක් සිදුවේ.

Pignataro v Gilroy

Pignataro, Gilroy ගෙන් හාල් බෑග් 140ක් මිල දී ගැනීමට පෙබරවාරි 27 දින චෙක්පතක් එව්වේ ය. ඒ සඳහා නිකුත් කිරීමේ නියෝගයක් ද ඉල්ලා සිටි අතර Gilroy එය ද නිකුත් කළේ ය. මින් බෑග් 125ක් රැගෙන ගිය අතර හාල් බෑග් 15ක් Gilroy ගේ ව්‍යාපාර ස්ථානයේ ඉතිරිව තිබුණි. එය මාර්තු 25 දින වන තුරුත් Pignataro රැගෙන ගියේ නැත. එදින ඒවා සොරතමට ලක්ව තිබූ අතර එම සොරකමට Gilroy ගේ කිසිම නොසැලකිල්ලක් හේතු වී තිබුණේ ද නැත. Pignataro අලාභ ඉල්ලා Gilroy ට විරුද්ධව නඩු පැවරූ අතර අධිකරණය තීරණය කළේ Pignataro ගේ කැමැත්ත ඇතිව Gilroy විසින් කොන්දේසි විරහිතව එම භාණ්ඩ ගිවිසුමට අදාළ කර තිබූ නිසා එහි හිමිකම Pignataro ට මාරු වී ඇති බවත් Gilroy විසින් එරෙහි නඩු පැවරිය නොහැකි බවත් ය.

Healy v Howlett & sons (1917)1 KB 337

මැකරල් මාළු තොග මිල දී ගැනීම සඳහා A,B,C, යන තිදෙනා D නම් විකුණුම්කරු සමග එකගත්වයකට එළඹුණි. එකගත්වයට අනුව A,B,C, සඳහා පිළිවෙළින් මාළු පෙට්ටි 20, 85 සහ 85 ඇණවුම් කරන ලදී. A,B,C, සඳහා පිළිවෙළින් මාළු පෙට්ටි 190ක් දුම්රිය බලධාරීන් වෙත භාර දුන් අතර අදාළ දුම්රිය ස්ථානවලදී අදාළ පුද්ගලයාට නියමිත මාළු පෙට්ටි ප්‍රමාණයක් ලබා දෙන ලෙසට D විසින් උපදෙස් දුනි. නමුත් දුම්රිය ප්‍රමාද වීම නිසා මාළු සියල්ල නරක් විය. මේ අවස්ථාව වන විට මාළු තොගය පැවතියේ නිශ්චිත නොවන භාණ්ඩ ලෙසිනි. මන් ද එක් එක් ගැණුම්කරුවා සඳහා මාළු පෙට්ටි වෙන් නොකොට තොගයක් ලෙස පැවතුනි. එම නිසා D වෙත තවදුරටත් අයිතිය පවතින බවත් D විසින් අලාභ භාර ගත යුතු බවත් අධිකරණය තීරණය කරන ලදී.

East Port Navigation Corperation Case

මෙම නඩුවේ දී පැමිණිලිකරු නැව්ගත කරන ලද බෙදා වෙන් නොකළ විශාල කොප්පරා තොගයකින් ටොන් 6000 ක් මිලට ගත්තේ ය. රොට්‍රඩෑම් සහ හැම්බර්ග් වරායන්වල නවත්වන විට ක්‍රම ක්‍රමයෙන් අන් අයගේ කොප්පරා තොග ඉවත් වූ පසු පැමිණිලිකරුගේ කොප්පරා තොගය පමණක් ඉතිරි විය. අධිකරණය ප්‍රකාශ කළේ ක්‍රම ක්‍රමයෙන් තේරීමට ලක් කිරීම මගින් පැමිණිලිකරුගේ කොප්පරා තොගය වෙන් වීම නිසා ඒවා නිශ්චිත භාණ්ඩ බවට පත් ව ඇති බවයි.

ගැණුම්කරුට හෝ ගැණුම්කරුට යැවීම සඳහා ප්‍රවාහකයෙකුට හෝ ගැණුම්කරු නම් කළ හෝ නොකළ ඇප මත භාණ්ඩ භාර ගන්නෙකුට (Bailee) භාණ්ඩ භාර දෙන අවස්ථාවේ දී විකුණුම්කරු විසින් කොන්දේසි විරහිත ව එම භාණ්ඩ ගිවිසුම වෙනුවෙන් වෙන් කළා සේ සැලකෙන බව භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 19 වන වගන්තිය දක්වා ඇත.

## අයිතිකරු නොවන පුද්ගලයෙකු භාණ්ඩ විකිණීම

දේපල නීතියේ මූලධර්මයක් වන්නේ, දේපල විකිණිය හැකි වන්නේ නීත්‍යානුකූල අයිතිකරුට පමණක් බවයි. එම නිසා අයිතිකරු නොවන පුද්ගලයෙකු දේපළ විකුණා ඇති විටක ගැණුම්කරු එම භාණ්ඩ සත්භාවයෙන් ප්‍රතිෂ්ඨාවක් සඳහා මිලට ගෙන ඇත්තේ වුව ද හොඳ අයිතියක් හිමි නොවේ. මෙය Nemo Dat Quod Non Habet යන මූලධර්මයෙන් ප්‍රකාශ වේ. වෙනත් ආකාරයකට ප්‍රකාශ කරන්නේ නම් ඉහත මූලධර්මයේ අදහස වන්නේ අයිතියක් නැති දෙයක් පැවරිය නොහැකිය යන්නයි. එම නීති මූලධර්ම භාණ්ඩ විකිණීමේ ආඥා පනතට ද ඇතුළත් කර ඇත. එම නිසා භාණ්ඩ විකිණිය හැක්කේ ද අයිතිකරුට පමණි. අයිතිකරු නොවන පුද්ගලයෙකු භාණ්ඩ විකුණා ඇති විටෙක ගැණුම්කරු සද්භාවයෙන් මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවකට මිලට ගෙන ඇත්තේ වුව දල ගැණුම්කරුට හොඳ අයිතියක් හිමි නොවේ.

කෙසේ නමුත් භාණ්ඩ විකිණීමේ ආඥා පනත මෙම රීතියට ව්‍යතිරේඛ කිහිපයක්ම පිළගනී. එසේම අධිකරණ විසින් ද ඇතැම් ව්‍යතිරේඛ අවස්ථාවන් දක්වා ඇත. එම නිසා එකී ව්‍යතිරේඛ අවස්ථාවන් යටතේ අයිතිකරු නොවන පුද්ගලයෙකුගෙන් භාණ්ඩ මිලට ගන්නා වූ ගැණුම්කරුට හොඳ අයිතියක් හිමි වේ. එකී ව්‍යතිරේඛ අවස්ථාවන් වන්නේ,

### 1 විකුණුම්කරුගේ භුක්තියේ තිබෙන ගැණුම්කරුට අයිති භාණ්ඩ නැවත විකිණීම

විකුණුම්කරුගේ භුක්තියේ තිබෙන ගැණුම්කරුට අයිති භාණ්ඩ විකුණුම්කරු විසින් නැවත විකුණා ඇති විටෙක එම භාණ්ඩ සද්භාවයෙන් මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවකට එම භාණ්ඩවල භුක්තිය ද හිමි වන්නා වූ ගැණුම්කරුට හොඳ අයිතියක් හිමි වේ. උදාහරණ වශයෙන් A විසින් රෙදි සෝදන යන්ත්‍රයක් B හට විකුණා පසු දින Bගේ නිවසට ගෙනවිත් භාර දෙන තෙක් තමාගේ භුක්තියේ තබා ගෙන සිටී. එහෙත් පසුව B හට කරන ලද විකිණීම පිළිබඳ දැන නොසිටි C හට එම රෙදි සෝදන යන්ත්‍රය විකුණා රැගෙන යාමට ඉඩ හරී. මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවකට සද්භාවයෙන් මෙම රෙදි සෝදන යන්ත්‍රයේ භුක්තිය හිමි වූ C හට හොඳ අයිතියක් හිමි වේ.

### 2 ගැණුම්කරුගේ භුක්තියේ තිබෙන විකුණුම්කරුට අයිති භාණ්ඩ විකිණීමක්

ගැණුම්කරුගේ භුක්තියේ තිබෙන්නේ වුව ද එම භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට මාරු නොමැති භාණ්ඩයක් එකී ගැනුම්කරුගෙන් නැවත මිලදී ගන්නා සද්භාවී පාර්ශ්වයකට එම භාණ්ඩ සම්බන්ධයෙන් යහපත් අයිතියක් හිමි වේ. උදාහරණ වශයෙන් A විසින් රෙදි සෝදනයන්ත්‍රයක් B හට විකුණයි. B විසින් මිල චෙක්පතකින් ගෙවන ලද නිසා එයට මුදල් ලැබෙන තෙක් විකුණුම්කරු වෙතම අයිතිය රඳවාගෙන එම රෙදි සෝදන යන්ත්‍රය B හට රැගෙන යාමට ඉඩ හරී. B විසින් මෙම රෙදි සෝදන යන්ත්‍රය C හට විකුණා භාර දේ. සද්භාවයෙන් මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවක් සඳහා මෙම රෙදි සෝදන යන්ත්‍රයේ භුක්තිය ද C හට හිමිව ඇත්නම් C හට හොඳ අයිතියක් හිමි වේ.

### 3 වෙළෙඳ නියෝජිතයා විසින් කරන ලද විකිණීමක්

වෙළෙඳ නියෝජිතයෙකු යනු ප්‍රධානියාගේ භාණ්ඩ තමාගේ භුක්තියේ තබාගෙන සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර අත්පිට මුදලට හෝ ණයට භාණ්ඩ විකිණීම කරනු ලබන නියෝජිතයාය. වෙළෙඳ නියෝජිතයෙකු විසින් සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර භාණ්ඩ විකුණා ඇති විටෙක ඒවා සම්බන්ධව වෙළෙඳ නියෝජිතයාට අයිතියක් නොමැති වුව ද, සද්භාවයෙන් මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවකට එම භාණ්ඩ මිලට ගන්නා වූ ගැණුම්කරුට හොඳ අයිතියක් හිමි වේ.

### 4 ප්‍රතිබන්ධන යටතේ කරනු ලබන විකිණීමක්

ප්‍රතිබන්ධන රීතියෙන් ප්‍රකාශ වන්නේ යමෙකු කිසිවක් ප්‍රකාශිතව හො ව්‍යංගයෙන් සඳහන් කර ඇති විටෙක පසුව එම ප්‍රකාශය කළේ නැත යැයි කිව නොහැකි බවයි. එම නිසා භාණ්ඩවල නියම අයිතිකරු විසින් ඒවා විකිණීම සඳහා විකුණුම්කරුට අයිතියක් තිබේ යැය විශ්වාස කිරීමට

ගැණුම්කරුව පොළඹවා ඇති විටෙක සද්භාවයෙන් වටිනාකමක් සඳහා එම භාණ්ඩ මිලට ගන්නා ගැණුම්කරුට හොඳ අයිතියක් හිමි වන්නේ විකුණුම්කරු ප්‍රතිබන්ධනයෙන් අයිතිකරු බවට පත්වන නිසා ය. උදාහරණ වශයෙන් A විසින් තමාගේ මෝටර් රථය B හට විකිණීමට අයිතියක් තිබේ යැයි විශ්වාස කිරීමට C ව පොළඹවා ඇති විටෙක ඒ බව විශ්වාස කරමින් C විසින් B ගෙන් එම මෝටර් රථය මිලට ගෙන ඇති විටෙක B අයිතිකරු නොවුවද ප්‍රතිබන්ධනයෙන් අයිතිකරු බවට පත්වන නිසා C හට හොඳ අයිතියක් හිමි වේ.

### 5 හිස් කළ හැකි ගිවිසුමක් යටතේ තබාගෙන සිටින භාණ්ඩ විකිණීමක්

විකුණුම්කරු විසින් භාණ්ඩ තබා ගෙන සිටින්නේ හිස් කළ හැකි ගිවිසුමක් යටතේ වන විටෙක ඒවා සද්භාවයෙන් මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවකට මිලට ගන්නා වූ ගැණුම්කරුට හොඳ අයිතියක් හිමි වේ. උදාහරණ වශයෙන් A යන අය බීමත්ව සිටිය දී තමාගේ මෝටර් රථය B හට විකුණා භාර දේ. A බීමත්ව සිටි නිසා මෙම ගිවිසුම හිස් කළ හැකි ගිවිසුමක් වන අතර B මෙම මෝටර් රථය තබාගෙන සිටින්නේ හිස් කළ හැකි ගිවිසුමක් යටතේ ය. C විසින් මෙම භාණ්ඩ B ගෙන් මිලට ගන්නේ සද්භාවයෙන් සහ මිල යැයි කියනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවකට නම් C හට හොඳ අයිතියක් හිමි වේ.

ipc.elearning.lk®

### 6 විවෘත වෙළෙඳපොළේ කරනු ලබන භාණ්ඩ විකිණීමක්

විවෘත වෙළඳපොළ යනු දවසේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර යම් නිශ්චිත වර්ගයක භාණ්ඩ විකුණනු ලබන වෙළෙඳපොළයි. සාප්පු බඩු විකිණීම සඳහා නගරයේ වීථිවල තිබෙන සාප්පු, සිල්ලර බඩු විකිණීම සඳහා වන සුපිරි වෙළෙඳසැල්, පංචිකාවත්තේ මෝටර් රථ අමතර කොටස් වෙළඳපොළ, යනාදිය විවෘත වෙළෙඳපොළට උදාහරණ වේ. ගැණුම්කරුවෙකු භාණ්ඩ මිලට ගන්නේ අයිතිකරු නොවන පුද්ගලයෙකුගෙන් වුව ද ඒවා මිලට ගන්නේ සද්භාවයෙන් විවෘත වෙළඳපොළේ දී නම් ගැණුම්කරුට හොඳ අයිතියක් හිමි වේ.

### 7 විශේෂ අයිතියක් යටතේ කරනු ලබන්නා වූ විකිණීමක්

භාණ්ඩ විකුණනු ලබන්නේ අයිතිකරු නොවුව ද, විකුණුම්කරුට විකිණීමට නීති මගින් විශේෂ අයිතියක් දී ඇති විටෙක ඒවා මිලට ගන්නා වූ ගැනුම්කරුට හොඳ අයිතියක් හිමි වේ.

උදා - පිස්කල් වෙන්දේසියේ භාණ්ඩ විකිණීම

### 8 නෞභාර පත්‍රයක් යටතේ කරනු ලබන්නා වූ විකිණීමක්

### අයිතිය බැහැර කිරීම / භාණ්ඩ රඳවා ගැනීමේ අයිතිය

ගිවිසුමේ නියමයන් මගින් හෝ අදළ කිරීමෙන්, යම් කොන්දේසියක් ඇත්නම් ඒවා පූර්ණය කරන තුරු භාණ්ඩ නිදහස් කිරීමේ අයිතිය වෙළෙන්දාට රඳවා ගත හැක. මෙවැනි අවස්ථාවක කොන්දේසි ඉටු වන තුරු භාණ්ඩයේ හිමිකම ගැණුම්කරුට මාරු නොකිරීම, ගැණුම්කරු විසින් අදාළ භාණ්ඩ පාවිච්චි කිරීමේ කාර්යයට භාරදීම කෙරෙහි බාධාවක් නොවේ. එනම් නියත භාණ්ඩයක් ලෙස විකුණුව ද මුදල් ගෙවා අවසන් වනතුරු එහි හිමිකම මාරු නොවිය යුතු බවට වන කොන්දේසියක් ඇත්නම් එසේ මාරු නොවිය යුතුය.

බලන්න, Dennant V Skinner and Collon (1948) 2 KB 164

උදාහරණය

භාණ්ඩ නැව්ගත කර හා නෞභාර පත්‍රය මගින් අදාළ විකුණුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු

විසින් භාණ්ඩ භාර දීමේ නියෝගය ලබා දෙන තාක් අදාළ හිමිකම මාරු නොවේ.

ipcelearning.lk®

### වෙන්දේසියක් මඟින් විකිණීම

වෙන්දේසියකදී වෙන්දේසිකරු විසින් මිටිය පහත හෙළීමෙන් හෝ වෙනත් චාරිත්‍රානුකූල ක්‍රමයකට අර්පණය ප්‍රතිග්‍රහණය කළ විට අදාළ වෙන්දේසියේ විකිණීම සම්පූර්ණ වේ. ඒ කාලයට පෙර ලංසු තැබීම අවසන් කළ හැකිය. ලංසුව යනු අර්පණයයි. ඒ අනුව ප්‍රසිද්ධ වෙන්දේසියකදී එහි සිරිත් අනුව යමෙකු භාණ්ඩ විකුණුවහොත් ඔහු එහි අයිතිකරු නොවුවද භාණ්ඩයේ හිමිකම ලබා ගන්නා අයට හොඳ අයිතියක් ලැබේ.

### භාණ්ඩ කොටස් වශයෙන් භාරදීම

වෙනත් යම් අකාරයකින් එකඟ වී නොමැති නම් භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුම වන භාණ්ඩ එකවරකදී ගැණුම්කරුට භාර දිය යුතුය. එසේ නොවන විටදී කොටස් වශයෙන් භාරදීම ප්‍රතික්ෂේප කිරීමට ගැණුම්කරුට හැකියාවක් ඇත.

Dennant V Skinner and Collon

මෙහිදී නලා 600 ක් විකිණීමට ගිවිසුමකට එළඹුණි. කෙසේ නමුත් ගිවිසුමේ සඳහන් වූයේ භාණ්ඩ

භාර දීම අවැසි පරිදි සිදු කරන බවයි. ඒ අනුව කොටස් වශයෙන් භාණ්ඩ භාරදීම ප්‍රතික්ෂේප කළ නොහැකි බව අධිකරණය ප්‍රකාශ කරන ලදී.

භාණ්ඩ කොටස් වශයෙන් භාරදීමට එකග වී ඇති අවස්ථාවකදී භාණ්ඩවල අයිතිය හුවමාරු වන්නේ කවර අවස්ථාවකදීද යන්න හදුනා ගත යුතුය. එහිදී යම් කොටසක භාර දීම උල්ලංඝණය වී ඇත්තේ නමුත් ඊට ප්‍රථම භාර දුන් භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය මාරු වූවා සේ සැලකේ.

## භාණ්ඩ විකිණීමේ ගිවිසුමක පාර්ශවකරුවන්ට හිමි ප්‍රතිකර්ම

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක පාර්ශවකරුවෙකු විකුණුම්කරු වශයෙන් හෝ ගැණුම්කරු වශයෙන් සිය කොන්ත්‍රාත්තුමය බැදීම් ඉෂ්ඨ කිරීම පැහැර හැරිය හැකිය. ඇතැම් විට ගැණුම්කරු මිල ගෙවීම පැහැර හැරිය හැකිය. නැතහොත් විකුණුම්කරු විසින් ගැණුම්කරුට භාණ්ඩ භාර දීම පැහැර හැරිය හැකි ය. ඇතැම් විට භාණ්ඩ විකිණීමේ ආඥා පනත දක්වා ඇති ව්‍යංග කොන්දේසි උල්ලංඝණය කළ හැකිය. එවැනි අවස්ථාවලදී භාණ්ඩ විකිණීමේ ගිවිසුමක පාර්ශවකරුවන්ට හිමි ප්‍රතිකර්ම,ප්‍රධාන අවස්ථාවන් දෙකක් යටතේ දැක්විය හැකි ය. ඒවා නම්

- ගැණුම්කරු විසින් භාණ්ඩ විකිණීමේ ගිවිසුම කඩ කර ඇති විටක විකුණුම්කරුට හිමි ප්‍රතිකර්ම
- විකුණුම්කරු විසින් භාණ්ඩ විකිණීමේ ගිවිසුම කඩ කර ඇති විටක ගැණුම්කරුට හිමි ප්‍රතිකර්ම

ipc.elearning.lk®

## විකුණුම්කරුට හිමි ප්‍රතිකර්ම

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 27 වන වගන්තිය අනුව ගැණුම්කරුගේ යුතුකම වනුයේ එකග වූ භාණ්ඩ භාර ගැනීම හා ඒ සඳහා මිල ගෙවීමයි. යම් හෙයකින් ගැණුම්කරු මිල ගෙවා නැති නම් ඔහුට භාණ්ඩ සපයන ලද විකුණුම්කරු මිල නොලත් විකුණුම්කරු වේ. මිල නොලත් විකුණුම්කරු කවරේද යන්න පැහැදිලිව 38 වන වගන්තිය මඟින් දක්වා ඇත. ඒ අනුව ගැණුම්කරු විසින් විකුණුම්කරුට,

- විකුණුම් මිල සම්පූර්ණයෙන් ම ගෙවා නොමැති විට හෝ
- විනිමය බිලකින් හෝ වෙනත් යම් ගනුදෙනු කළ හැකි ලියවිල්ලකින් මිල ගෙවා ඇති විටෙක එය අගරු වූ විට එම විකුණුම්කරු මිල නොලත් විකුණුම්කරු වශයෙන් සැලකේ.

මිල නොලත් විකුණුම්කරුවෙකුට හිමි ප්‍රතිකර්ම දෙයාකාර වේ. එනම්,

1 භාණ්ඩ වලට එරෙහිව තිබෙන ප්‍රතිකර්ම

2 ගැණුම්කරුට එරෙහිව තිබෙන ප්‍රතිකර්ම

## භාණ්ඩ වලට එරෙහිව තිබෙන ප්‍රතිකර්ම

- ලියමේ බලය
- ගමන් කරමින් තිබෙන භාණ්ඩ මග නතර කිරීමේ බලය
- නැවත විකිණීමේ බලය

### ලියමේ බලය

ගැණුම්කරුට අයිතිය මාරු වූ භාණ්ඩ මිල නොලත් විකුණුම්කරුගේ භුක්තියේ තිබෙන විටෙක මිල ගෙවන තෙක් එම භාණ්ඩ විකුණුම්කරු වෙතම ලබා ගැනීමට තිබෙන්නා වූ අයිතිය ලියමේ බලයයි.

භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට මාරු නොවී ඇති විටෙක දී පවා මිල ගෙවන තෙක් ගැණුම්කරුට විකුණන ලද භාණ්ඩ විකුණුම්කරුට තබාගෙන සිටීමට තිබෙන්නා වූ අයිතිය රඳවාගැනීමේ අයිතිය වශයෙන් හඳුන්වන අතර මෙය ද ලියමේ බලය හා සමාන බලය කි. එහෙත් ලියමේ බලය යටතේ හෝ රඳවා ගැනීමේ බලය යටතේ එම භාණ්ඩ විකිණීමට හෝ පාවිච්චි කිරීමට හෝ වෙනත් යම් දෙයක් කිරීමට අයිතිය හිමි නොවේ. භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 41(1) වගන්තිය අනුව ලියමේ බලය ක්‍රියාත්මක කළ හැක්කේ පහත අවස්ථාවලදීය.

■ භාණ්ඩ අත්පිට මුදල් පදනමට විකුණා ඇති නමුත් මුදල් ලැබී නොමැති විටක

■ භාණ්ඩ ණයට විකුණා ඇත්තේ වුව ද ණය කාල සීමාව අවසන් වී තිබිය ගැණුම්කරු දී මිල ගෙවා නැති විටෙක

■ ගැණුම්කරු වස්තු භංගත්වයට පත්ව ඇති විටෙක

අධිකරණ විසින් ලියමේ බලය අර්ථ නිරූපනය කර ඇති ආකාරය අනුව භාණ්ඩ වල මිලෙන් කොටසක් ගෙවා නැත්තේ වුවද ලියන් බලය ක්‍රියාත්මක කිරීමේ හැකියාව විකුණුම්කරුට පවතී. කෙසේ වෙතත් ලියමේ බලය හෝ රඳවා ගැනීමේ බලය පහත සඳහන් අවස්ථාවල දී අවසානයට පත් වේ.

i ගැණුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට භාණ්ඩ භාර දීම සඳහා ස්වාධීන ප්‍රවාහනකරුවෙකුට භාණ්ඩ භාර දුන් වහාම,

Vaply V Gibson (1847) 3 CB 807

මෙම නඩුවේදී B විසින් G ගෙන් රෙදි තොගයක් මිලට ගැනීමට ගිවිසුමකට එළඹුණි. ගිවිසුම අනුව B විසින් රෙදි තොගය ප්‍රවාහනය සඳහා නාවික නියෝජිතයා වන L ට භාර දුන්නේය. කෙසේ නමුත් B ගේ නියෝජිතයා වන A නාවික නියෝජිතයාට භාණ්ඩවල ඇසුරුම් වෙනස් කිරීම සඳහා නැවත G වෙත යවන ලෙස නියෝග කළේය. එම නියෝගය අනුව L විසින් භාණ්ඩ G වෙත යවන ලද අතර භාණ්ඩ G ගේ සන්තකයේ පවතින අතරතුර B බුන්වත් බව ප්‍රකාශ කරන ලදී. G ට මෙම භාණ්ඩ සම්බන්ධයෙන් ලියන් බලය ක්‍රියාත්මක කල හැකිද යන ගැටලුවේදී අධිකරණය කියා සිටියේ භාණ්ඩ ප්‍රවාහකයාට භාර දීමෙන් පසු ලියමේ බලය අවසන් වන බවත් නැවත සන්තකය ලබා ගත් පමණින් නැවත එම අයිතිය නොලැබෙන බවත්ය. ඒ අනුව ලියන් බලය ක්‍රියාත්මක කිරීමට G ප්‍රමාද බව අධිකරණය ප්‍රකාශ කරන ලදී.

ii ගැණුම්කරු හෝ ඔහුගේ නියෝජිතයා භාණ්ඩවල භුක්තිය ලබාගෙන ඇති විටෙක

iii විකුණුම්කරු විසින් ලියමේ බලය අත්හැර ඇති විටෙක

## ගමන් කරමින් තිබෙන භාණ්ඩ මග නතර කිරීමේ බලය

ගැණුම්කරු හෝ ඔහුගේ නියෝජිතයාට භාණ්ඩ භාරදීම සඳහා ස්වාධීන ප්‍රවාහනකරුවෙකුට භාණ්ඩ භාරදුන් වහාම භාණ්ඩ ගමන් කිරීම ආරම්භ කරයි. එසේ ගමන් කරමින් තිබෙන භාණ්ඩ, ගමන් කිරීම නතර කොට මිල නොලත් විකුණුම්කරු හට මඟ නතර කිරීමේ බලය ක්‍රියාත්මක කළ හැක්කේ ගැණුම්කරු වස්තුභංගත්වයට පත්ව ඇති විටෙක දී පමණි. එහෙත් ගැණුම්කරු වස්තුභංගත්වයට පත්වූ බව අධිකරණය විසින් ම තීරණය කිරීම අත්‍යාවශ්‍ය නොවේ. ගැණුම්කරු සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර වෙළෙඳ ණය ගෙවීමට අපොහොසත් වන විටෙක, ගැණුම්කරු වස්තුභංගත්වයට පත් වූ පුද්ගලයෙකු වශයෙන් සලකා, මිල නොලත් විකුණුම්කරුට මෙම අයිතිය ක්‍රියාත්මක කළ හැකිය. කෙසේ නමුත් ගැණුම්කරු හුදු මිල නොගෙවීමක් මත මෙම බලය ක්‍රියාත්මක කළ නොහැකි බව Wiseman V Vandeputh නඩුවේදී අධිකරණය ප්‍රකාශ කොට ඇත. භාණ්ඩවල භුක්තිය සත්‍ය වශයෙන් ම විකුණුම්කරු ලබාගැනීමෙන් හෝ භාණ්ඩවල භුක්තියේ තිබෙන්නා වූ ස්වාධීන ප්‍රවාහනකරුවෙකුට භාණ්ඩ සම්බන්ධයෙන් මඟ නතර කිරීමේ

බලය ක්‍රියාත්මක වන බවට මිල නොලත් විකුණුම්කරු විසින් දැනුම් දුන් විට ස්වාධීන ප්‍රවාහනකරු විසින් මෙම භාණ්ඩ මිල නොලත් විකුණුම්කරුට භාර දීමෙන් මඟ නතර කිරීමේ බලය ක්‍රියාත්මක කළ හැකිය. මේ සඳහා වන වියදම් මිල නොලත් විකුණුම්කරු දැරිය යුතුය.

මඟ නතර කිරීමේ බලය පහත සඳහන් අවස්ථාවන්වල දී අවසානයට පත් වේ.

i ගමනාන්තයේ දී හෝ ඊට ප්‍රථම ගැණුම්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් භාණ්ඩවල භුක්තිය භාරගෙන ඇති විටෙක,

ii ගමනාන්තයේ දී ගැණුම්කරුට භාණ්ඩ භාරගන්නා ලෙසට ස්වාධීන ප්‍රවාහනකරු දැනුම් දී ඇති විටෙක,

iii ගැණුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට භාණ්ඩ භාර දීම ස්වාධීන ප්‍රවාහනකරු වැරදි ආකාරයකින් ප්‍රතික්ෂේප කරන විටෙක.

## නැවත විකිණීමේ බලය

මිල නොලත් විකුණුම්කරු හට ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ නැවත විකිණීමේ අයිතිය හිමි වන්නේ පහත සඳහන් අවස්ථාවන්වලදීය.

ipcelearning.lk®

i එම භාණ්ඩ නෂ්‍ය වන ස්වරූපයේ භාණ්ඩ වන විටෙක. එනම් එම භාණ්ඩ ඉක්මනින් විනාශ වන එළවළු, මාළු, පලතුරු වැනි භාණ්ඩ වන විටෙක,

ii නැවත විකිණීමේ අයිතිය තබා ගෙන භාණ්ඩ නැවත විකුණා ඇති විටෙක,

iii සාධාරණ කාලයක් තුළ මිල නොගෙවනු ලැබුවහොත්, ඒවා නැවත විකුණනු ලබන බවට ගැණුම්කරු දැනුම් දීමෙන් පසුව ද ගැණුම්කරු මිල නොගෙවා ඇති විටෙක.

එසේ නැවත විකුණූ අවස්ථාවලදී දෙවන ගැණුම්කරුට, පළමු ගැණුම්කරුට එරෙහිව හොඳ අයිතියක් ලැබේ.

## ගැණුම්කරුට එරෙහිව විකුණුම්කරුට තිබෙන ප්‍රතිකර්ම

විකුණුම්කරුවෙකු හට ගැණුම්කරුවකුට එරෙහිව තිබෙනා ප්‍රතිකර්ම ප්‍රධාන වශයෙන් දෙයාකාර වේ. ඒවා නම්,

- නඩුවක් පවරා මිල අයකර ගැනීම

■ නඩුවක් පවරා භාණ්ඩ භාර නොගැනීමේ අලාභ අයකර ගැනීම

## නඩුවක් පවරා මිල අයකර ගැනීම

භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට මාරු වී ඇති විටෙක, ගැණුම්කරු විසින් එම භාණ්ඩ එම භාණ්ඩවල මිල විකුණුම්කරු හට ගෙවීම පැහැර හරිනු ලබයි නම්, ගැණුම්කරුට විරුද්ධව නඩුවක් පවරා මිල අයකර ගැනීමට විකුණුම්කරුට අයිතිය තිබේ.

## භාණ්ඩ භාර නොගැනීමේ අලාභ අයකර ගැනීම

ගැණුම්කරු විසින් භාණ්ඩ භාරගැනීම පැහැර හරිනු ලබන විටෙක, ගැණුම්කරුට විරුද්ධව නඩුවක් පවරා භාණ්ඩ භාර නොගැනීමේ අලාභ අය කර ගත හැකිය. මෙවන් විටෙක දී අයකරගත හැකි අලාභය වන්නේ, භාණ්ඩ භාර නොගැනීම හේතු කොටගෙන සෘජුවම සහ ස්වාභාවයෙන් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර පැන නගින්නා වූ අලාභය වේ. එම භාණ්ඩ සඳහා වෙළෙඳපොළ මිලක් පවතී නම්, සාමාන්‍යයෙන් ගිවිසුමේ මිල සහ වෙළෙඳපොළ මිල අතර වෙනස අලාභය වශයෙන් සැලකිය හැකිය. කෙසේ නමුත් ගිවිසුම කඩ කිරීම නිසා සිදුවූ අලාභය වෙළෙඳපොළ මිල පමණක්ම නොවන අවස්ථාවලදී මෙම රීතිය ක්‍රියාත්මක කිරීම යෝග්‍ය නොවන බව අධිකරණය විසින් තීරණය කොට තිබේ.

ipc.elearning.lk®

Brown and Company V. Steuart Industries Ltd. (1982) 2 SLR 440

ශ්‍රී ලංකාවේ තීරණය වූ මෙම නඩුවේදී විකුණුම්කරු මහන මැෂින් නිපදවන්නෙකු වන අතර ඔහුගේ මහන මැෂින් අලෙවි නියෝජිතයා ලෙස B පත්කර තිබුණි. B මසකට අවම වශයෙන් මහන මැෂින් 250 ක් විකුණුම්කරුගෙන් මිලට ගැනීමට එකඟ විය. කෙසේ නමුත් සමඟ එකඟ වී තිබූ ආකාරයට මහන මැෂින් 1964 ක් මිලදී නොගැනීම නිසා සිදු වූ අලාභය ඉල්ලා නඩු පවරන ලදී.

එහිදී සිදු වූ අලාභය වශයෙන් විකුණුම්කරු විසින් දරන ලද ප්‍රචාරණ වියදම් සහ තවත් රුපියල්

110,000 මුදලක් පහළ අධිකරණය විසින් වන්දි ලෙස පිරිනමන ලදී. කෙසේ නමුත් භාණ්ඩ සඳහා වෙළෙඳපොළක් පැවති බැවින් හා ගිවිසුම්ගත මිලට වඩා වෙළඳපොළ මිල අඩු නොවූ බැවින් විකුණුම්කරුට අලාභයක් සිදු වී නොමැති බව ඉහළ අධිකරණයේදී ගැණුම්කරුවන් වෙනුවෙන් තර්ක කරන ලදී. එහිදී අලාභය වශයෙන් විකුණුම් මිල මත ඇති වන පාඩුවට අතිරේකව ආවස්ථික පිරිවැය හා අනෙකුත් පිරිවැය සලකා බැලූ අධිකරණය පහළ අධිකරණයේ මතය අනුමත කරන ලදී.

## ගැණුම්කරුවකු හට තිබෙන්නා වූ ප්‍රතිකර්ම

විකුණුම්කරුවෙකු විසින් භාණ්ඩ විකිණීමේ ගිවිසුම කඩ කර ඇති විටක, ගැණුම්කරුවෙකුට ප්‍රතිකර්ම ගණනාවක් හිමි වේ. ඒවා නම්,

### 1 භාණ්ඩ භාර නොදීම සම්බන්ධයෙන් නඩු පැවරීම

විකුණුම්කරු විසින් වැරදි ආකාරයකින් හෝ නොසැලකිලිමත් ලෙස කටයුතු කරමින් ගැණුම්කරුට භාණ්ඩ භාර දීම ප්‍රතික්ෂේප කරන විටක, විකුණුම්කරුට විරුද්ධව නඩුවක් පවරා සිදු වූ අලාභ අයකර ගත හැකිය.

### 2 නියත ඉටු කිරීමේ ආඥාවක් ලබා ගැනීම

විකුණුම්කරු විසින් ගිවිසගත් පරිදි ගැණුම්කරුට නිශ්චිත හෝ වෙන් කරන ලද භාණ්ඩ භාරදීම පැහැර හරිනු ලබන විටෙක, ගිවිසගත් පරිදි එකී ගිවිසුම ඉෂ්ඨ කරන ලෙස විකුණුම්කරුට එරෙහිව ගැණුම්කරුට අධිකරණයෙන් ලබා ගත හැකි ආඥාවයි. මෙම ආඥාව අධිකරණය විසින් නිකුත් කරනු ලබන්නේ ඉතා සීමිතව හා අධිකරණයේ අභිමතයට යටත්වය. එනම් විකුණුම්කරු විසින් ගැණුම්කරුට විකිණීමට පොරොන්දු වූ භාණ්ඩ, පහසුවෙන් වෙළෙඳපොලෙන් මිල දී ගැනීමට නොහැකි වීම, වැනි අවස්ථාවක දී ගැණුම්කරු හට අලාභ ගෙවීමෙන් සෑහීමට පත් කර නොහැකි නිසා මෙම ආඥාව නිකුත් කරනු ලබයි.

ipcelearning.lk®

### 3 මිල අයකර ගැනීම

ගැණුම්කරු විසින් විකුණුම්කරුට ගෙවන මිල, විකුණුම්කරුට විරුද්ධව නඩුවක් පවරා ආපසු ඉල්ලා සිටිය හැකිය. උදාහරණ වශයෙන් ගැණුම්කරු මිල ගෙවා ඇත්තේ වුවද විකුණුම්කරු විසින් ගිවිසුමේ සඳහන් භාණ්ඩ ගැණුම්කරුට භාර දීම ප්‍රතික්ෂේප කිරීම, විකුණුම්කරු විසින් තමාට අයිතියක් නැති භාණ්ඩ විකුණා ඇති විටක ගැණුම්කරුට එම භාණ්ඩ නියම අයිතිකරුට භාරදීමට සිදු වීම වැනි අවස්ථාවන්වල දී, විකුණුම්කරුට ගෙවන ලද විකුණුම් මිල, ගැණුම්කරුට අයකර ගත හැකි ය.

### 4 ගිවිසුමේ කොන්දේසියක් කඩ කර ඇති විට භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීම

### 5 ප්‍රතිඥාභාරයක් කඩකර ඇති අවස්ථාවලදී වන්දි ලබා ගැනීම